# පෙරවදන

නව සහශ්‍රයේ දී සිදු කළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ දැනට පවතින ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකි ය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ, සමාජීය හා පුද්ගල දුර්වලතා මග හරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේ දී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේ ය. නමුත් වර්තමානයේ දී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක් තීරණ ගනිමින් ඒ දේ පමණක් ම නැවත නැවත ඉදිරිපත් කිරීම මෙම පසුබෑමට එක් හේතුවකි.

මෙම තත්ත්වය මඟ හරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතු ව විෂය මාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනට ම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණාත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වන ආකාරයෙනි. මෙම අරමුණුම සාක්ෂාත් කර ගැනීම පිණිස ගුරුවරයාගේ කාර්ය භාරයෙහි පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන්ට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මඟ පෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේ දී මෙන් ම ශිෂ්‍යයන් ඇගයීමේ දී උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරීවන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙස ම එය විදුහල්පතිවරුන්ට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිත සම්පත් වෙන් කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් සේ උපකාරී වනු නොඅනුමාන ය.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් නිර්මාණශීලීබව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම කළ යුතුය. මක් නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා නිසාත් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයින්ට, ගුරු උපදේශකවරුන්ට හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගී වූ සියලු දෙනාට ම මගේ කෘතඥතාවය පිළි ගන්වමි.

මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංදේශය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතුය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වනු දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා ගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ විෂය යටතේ සිසුන් අත්පත් කර ගත යුතු නිපුණතා හඳුනා ගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බැවින් ඔබ්බට ගිය ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ක්‍රියාකාරකම් සන්තතිය නම් කොටසේ දී හමුවන නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම්, පරිසරය නිරීක්ෂණය සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස් කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදිව සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියළු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරයි. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය, සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මග පෙන්වීමක් බව සිතන්න. මේවා ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරීය, එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත් කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මේ අයුරින් පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් ඵලදායි ඉගෙනුමකට හේතු වේ.

තව ද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම් දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත් වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එම සිසුන් මෙසේ ඇගයීම් කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම පිළිබඳව සැලකිලිමත්වන්න.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

# 03 ලේඛක මණ්ඩලය

උපදේශනය - මහාචාර්ය ජේ.ඩබ්. වික්‍රමසිංහ මයා - අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
විමල් සියඹලාගොඩ මයා - සහකාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහාචාර්ය මාලනී ඇඳගම මිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
(විශ්‍රාමික)
මහාචාර්ය එම්.යූ. ද සිල්වා මයා - රුහුණු විශ්ව විද්‍යාලය (විශ්‍රාමක)
මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ මිය - කොළඹ විශ්ව විද්‍යාලය
ආචාර්ය එස් අනුෂියා මිය - අග්නිදිග විශ්ව විද්‍යාලය

අධ්‍යක්ෂණය - යූ. නවරත්නම් මයා - අධ්‍යක්ෂ - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

සම්බන්ධීකරණය - ඩී.එච්. චන්දිමා නිශානි ධර්මපාල මිය - ව්‍යාපෘති නායක - ඉතිහාසය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ලේඛක මණ්ඩලය

බී.එල්.ආර්. රෝහණ කුමාර මයා - ජාතික අධ්‍යාපන ආයතනය (විශ්‍රාමික )
එස්.එම්. දයානන්ද මයා - ජාතික අධ්‍යාපන ආයතනය (විශ්‍රාමික )
සී.එස්. ජයසිංහ මයා - ගුරු මධ්‍යස්ථානය, හොරණ
ඒ.ඉන්ද්‍රානි මිය - ජේසු බිළින්දාගේ කන්‍යාරාමය, රත්නපුර
ජාතික පාසැල, රත්නපුරය
ජේ.වී. කාන්ති මිය - කලාප කාර්යාලය, පානදුර
නන්දා මනම්පේරි මිය - ශාන්ත ජෝසප් බාලිකා ම.වි. කෑගල්ල
ආර්.ඩබ්.එස්. දෑල මිය - ද මැසනඩ් විද්‍යාලය, කඳාන
මංජරී පුංචිහේවා මිය - සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය,
හගුරන්කෙත
එස්.ඒ.එන්. පෙරේරා මිය - රන්වල මහානාග ම.වි., කෑගල්ල
ටී.බී. ඒකනායක මයා - කලාප අධ්‍යාපන කාර්යාලය, තලාතුඔය
ඉන්ද්‍රාණි මොහිදීන් මිය - ගුරු උපදේශක (විශ්‍රාමික)
එච්. වීරරත්න මයා - ගුරු උපදේශක (විශ්‍රාමික )
ඒ. සෙල්වේන්ද්‍රන් මයා - ගුරු විද්‍යාලය, කොටගල
යු .ඇල්.එම්. බසීර් මයා - කලාප කාර්යාලය, වත්තේගම

සිතියම්

කේ.ඒ.ලසන්ති ගිතානි මෙනවිය - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පරිගණක අක්ෂර සංයෝජනය

දිල්හානි පෙරේරා මිය

පිට කවරය

සන්ධ්‍යා අතපත්තු මෙනවිය

විවිධ සහාය

එස් රූපසිංහ
ශිරාණි සමරක්කොඩි මිය

# පටුන

| | පිටු අංක |
|---|---|
| පෙරවදන | I |
| සංඥාපනය | II |
| ලේඛක මණ්ඩලය | III |

## පටුන

| | |
|---|---|
| විෂය නිර්දේශය (පළමු කොටස ) | V |
| 1.0 හැඳින්වීම | 1 |
| 2.0 11 ශ්‍රේණියට අදාළ විෂය නිර්දේශයේ අරමුණු | 2 |
| 3.0 විෂය නිර්දේශය | 3 -9 |
| 4.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් | 10 |
| | |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය ( දෙවන කොටස ) | |
| හැඳින්වීම | |
| ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතිය | 11-14 |
| 11.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරුවීම | 15-44 |
| 11.2 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වෙනස්කම් | 45-88 |
| 11.3 විසි වන සියවසේ ආසියාතික රටවල නැගීම | 89-115 |
| 11.4 ලෝක මහා සංග්‍රාමය හා ලෝක සාමය සඳහා ප්‍රයත්න | 117-140 |
| 11.5 ලෝකයේ බල තුලනය - දෙවන ලෝක යුද්ධයෙන් පසු | 141-166 |
| 11.6 නිදහසින් පසු ශ්‍රී ලංකාව | 167-194 |
| | |
| තක්සේරු හා ඇගයීම (තුන්වන කොටස ) | |
| හැඳින්වීම | 195-197 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ | 198-205 |

# හැඳින්වීම

2007 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව නව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් හඳුන්වා දී ඇත. මෙය ඒ අනුව සැකසූ 11 වන ශ්‍රේණිය ඉතිහාසය විෂය සඳහා වූවකි.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය කොටස් තුනකින් සමන්විත වේ. ඒ අනුව පළමු කොටස විෂය නිර්දේශය ලෙස ද, දෙවන කොටස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ලෙස ද, තෙවන කොටස ඇගයීම් ලෙස ද සඳහන් වේ. විෂය නිර්දේශය තුළින් 11 ශ්‍රේණිය ඉතිහාසය විෂය සඳහා අදාළ විෂය අන්තර්ගතය සඳහන් කර ඇති අතර දෙවන කොටස මගින් ඊට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද යෝජනා කර ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් ළඟා කර ගැනීම තහවුරු කර හඳුනා ගැනීම සඳහා තක්සේරුව හා ඇගයීම උපකාර වනු ඇත.

මෙහි දී සැලකිලිමත් විය යුතු කාරණයක් වන්නේ විෂය අන්තර්ගතය සම්පූර්ණයෙන් ම ආවරණය වන පරිදි ක්‍රියාකාරකම් සකසා නොමැති බවයි. මෙහි ඉදිරිපත් කර ඇත්තේ ආදර්ශ කිහිපයක් පමණි. එම ආදර්ශ සැලකිල්ලට ගනිමින් ඔබ විසින් ක්‍රියාකාරකම් සැකසීම ද කළ යුතු අතර ඉදිරිපත් කර ඇති ආදර්ශ ක්‍රියාකාරකම් ද ඔබගේ නිර්මාණශීලිත්වය අනුව සංවර්ධනය කර ගැනීමට හැකි ය.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටු කරමින් නිපුණතා සපිරි නව ලොවට උචිත සිසු පිරිසක් බිහි කිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු.

ව්‍යාපෘති නායක

# පළමුවන කොටස
# විෂය නිර්දේශය

# 1.0හැඳින්වීම

ඉතිහාසය ඉගෙනීම මානව ශිෂ්ටාචාරයේ වර්ධනයේ දී සිදු වූ දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල මතුවන ගැටලු සහ ජයග්‍රහණවල විවිධාකාර වූ ස්වභාවය තුලනාත්මක ව හා විවේචනාත්මක ව අවබෝධ කොට ගැනීමයි. එය පරිසරය හා ජාතික උරුමයන් රැක ගනිමින් සියලු මනුෂ්‍ය වර්ගයාට එක් ව විසීමට හැකි යහපත් සමාජයක් ගොඩ නැගීමේ අරමුණු පෙරදැරි වන්නක් ද විය යුතු ය.

2007 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරන තුළින් ද හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා ඉතිහාසය පාසල් විෂය මාලාවට හර විෂයක් ලෙසින් ඇතුළත් කර ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන පාසල් විෂය මාලාව නිපුනතා පදනම් කර ගෙන සකස් වූවකි. ඒ අනුව හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා වූ ඉතිහාසය විෂය මාලාව ද සැලසුම් කිරීමේ දී හඳුනාගත් විෂය නිපුණතා පදනම් කර ගෙන සකස් කරන ලදී.

එකොළොස්වන ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. මෙය 2008 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිතය. තේමා හයකින් සමන්විත වූ මෙම විෂය නිර්දේශයට ශ්‍රී ලංකාවේ හා ලංකාව සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළ ලෝකයේ ඓතිහාසික සිදුවීම් ද තේමා සඳහා තෝරා ගෙන ඇත. ඒ අනුව එකොළොස්වන ශ්‍රේණිය සඳහා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීමේ සිට 1978 දක්වා කාලයත් විසිවන සියවසේ ආසියාතික රටවල නැගීම සහ ලෝක යුද්ධ සමය හා ඉන්පසු ලෝක බල තුලනය සිදු වූ ආකාරයත් අධ්‍යයනයට යොමු කර ඇත. ලෝකයේ මෙම ඓතිහාසික සිදුවීම් ලංකාවේ ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය මෙම තේමා අධ්‍යයනය කිරීමෙන් අවබෝධ වනු ඇත.

එමෙන් ම හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා වූ විෂය මාලාව අධ්‍යයනය කිරීම තුළින් පහත සඳහන් නිපුණතා සිසුන් ළඟා කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විමර්ශනයෙහි යෙදෙයි.
- වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ විමර්ශනාත්මක දැනුම උපයෝගී කර ගනියි.
- ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව විමසා බලමින් කටයුතු කරයි.
- වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන ආදර්ශයට ගෙන කටයුතු කරයි.
- ජාතික අනන්‍යතාව හඳුනා ගෙන ඒවා අගය කරමින් චරිතායතනය කර ගනියි.
- ඉතිහාසයේ අත්දැකීම් වර්තමාන සංසිද්ධීන් සඳහා ඵලදායි ලෙස භාවිත කරයි.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්දතීන් පිළිබඳ අභිමානවත් හැඟුමින් කටයුතු කරයි.
- විචාරශීලී හා විවේචනාත්මක චින්තන සංකල්ප වර්ධනය කර ගනියි
- ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කර ගනියි.

## 2.0 11 ශ්‍රේණියට අදාළ විෂයයේ අරමුණු

- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය පිළිබඳ විස්තර අධ්‍යයනය කිරීම .
- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා ඇති වූ සමාජ ආර්ථික වෙනස්කම් එතෙක් පැවති රටාවෙන් වෙනස් වන ආකාරය හඳුනා ගැනීම.
- විසිවන සියවසේ ආසියාතික රටවල් නැගී සිටි ආකාරය විමසා බැලීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලෝක සංග්‍රාමය නිසා අහිමි වූ මානව අයිතිවාසිකම් ආරක්ෂා කර ලෝක සාමය උදා කර ගැනීමට දැරූ ප්‍රයත්න පිළිබඳ විමසා බැලීම.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක බල තුලනය සඳහා ප්‍රධාන බලකඳවුරු දෙක අනුගමනය කළ ප්‍රතිපත්තිවල ක්‍රියාකාරීත්වය තුලනාත්මකව අධ්‍යනය කිරීම.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් ශ්‍රී ලංකාවේ සංවර්ධනය ක්‍රියාවලියට දායක වී ඇති ආකාරය පිළිබඳ ව විමර්ශනය කිරීම

## 3. විෂය නිර්දේශය

## 11.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ශ්‍රී ලංකාවේ බටහිර ජාතීන්ගේ බල ව්‍යාප්තිය සහ ඒ සමඟ ඇති වූ සමාජ, දේශපාලන, ආර්ථික වෙනස්වීම් පිළිබඳ විමර්ශනය කරයි | • පාලනයේ සිදු වූ දුර්වලතා ප්‍රයෝජ-නයට ගනිමින් බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය විග්‍රහ කරයි. | 11.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම<br>11.1.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම<br>- 1796 මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් සතුවීම<br>- ක්‍රි.ව. 1815 උඩරට යටත් කර ගැනීම | 04 |
| | • ස්වාධිපත්‍ය රැකගැනීම සඳහා බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ස්වදේශිකයින් නැගී සිටි ආකාරය විග්‍රහ කරයි. | 11.1.2 බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය<br>- ක්‍රි.ව. 1817 - 1818<br>- ක්‍රි.ව. 1848 | 04 |
| | • බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති කළ ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි. | 11.1.3 ආණ්ඩුක්‍රම විකාශය හා පරිපාලනය ක්‍රි.ව. 1947 දක්වා<br>- කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ<br>- මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>- මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>- ක්‍රි.ව. 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>- ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>- සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ | 12 |

## 11.2 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වෙනස්කම්

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ශ්‍රී ලංකාවේ බටහිර ජාතීන්ගෙ බල ව්‍යාප්තිය සහ ඒ සමඟ ඇති වූ සමාජ, දේශපාලන ආර්ථික වෙනස්වීම් පිළිබඳ විමර්ශනය කරයි | • වතු වගාවේ ව්‍යාප්තිය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් විමර්ශනය කරයි.<br><br>• බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ සමාජය තුළ ඇති වූ වෙනස්කම් විග්‍රහ කරයි.<br><br>• බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ඇති වූ අධ්‍යාපනික වෙනස්වීම් පිළිබඳ තොරතුරු විමර්ශනයකරයි.<br>• බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය විමර්ශනය කරයි. | 11.2 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වෙනස්කම්<br><br>11.2.1 ඉඩම් භුක්තිය හා අනිවාර්ය සේවය රාජකාරිය අවලංගු කිරීම<br><br>11.2.2 වතු වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය<br>11.2.3 පාරම්පරික කෘෂිකර්මය<br>11.2.4 නවීකරණය හා බටහිර කරණය<br>- මධ්‍යම පන්තියේ වර්ධනය<br>- කම්කරු ව්‍යාපාරය<br>- ජාතික ව්‍යාපාරය<br>11.2.5 අධ්‍යාපනය<br><br>11.2.6 ආගමික හා සංස්කෘතික පුනර්ජීවණය<br>- බෞද්ධ, හින්දු, ඉස්ලාම්, හා මිෂනාරී | 16 |

## 11.3 විසිවන සියවසේ ආසියාතික රටවල නැගීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • විසිවන සියවසේ ආසියාතික රටවල් නැගී සිටි ආකාරය ආදර්ශයට ගෙන කටයුතු කරයි. | • රටේ ස්වාධිපත්‍ය රැක ගැනීම සඳහා ඉන්දයානුවන් ආදර්ශ-වත් ව ක්‍රියාකළ ආකාරය ආදර්ශයට ගෙන කටයුතු කරයි | 11.3 විසිවන සියවසේ ආසියාතික රටවල නැගීම<br>11.3.1 ඉන්දියාව<br>- ජාතික ව්‍යාපාරය ආරම්භය<br>- මධ්‍යස්ථමතධාරීන්ගේ වැඩ සටහන් හා ජයග්‍රහණ<br>- සටන්කාමී ජාතික අනුරාගය නැගීම සහ මහත්මා ගාන්ධි<br>- ඉන්දියාවේ බෙදී යාම | 04 |
| | • ජපානය ලෝකයේ ප්‍රබල රටක් ලෙස ගොඩ නැගුණ ආකාරය අධ්‍යයනය කර ඉන් ලබා ගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි | 11.3.2 ජපානය<br>- ටොකුගුවා යුගය<br>- මෙයිජි ප්‍රතිසංස්කරණ<br>- ජපානය ලෝකයේ බලවත් රාජ්‍යයක් සේ නැගී සිටීම<br>- හිරෝෂිමා නාගසාකී විනාශවීමෙන් පසු මාෂල් සැලැස්ම ආශ්‍රයෙන් යලි ගොඩ නැගීම | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | • සැලැස්මකට අනුව කටයුතු කරමින් චීනය නැගීආකාරය සිටි අධ්‍යයනය කර ඉන් ලබාගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි. | 11.3.3 චීනය<br>- චීන විප්ලවයේ ප්‍රධාන අවස්ථා<br>* සුංයුත්සෙන් සහ චියැංකායිෂෙක්<br>- දෙවන ලෝක මහා සංග්‍රාමය යටතේ චීනය<br>- මහජන චීනයේ බිහිවීම<br>- ආර්ථික සැලැස්ම අරමුණු හා අපේක්ෂා<br>- සංස්කෘතික විප්ලවය<br>- විදේශ සම්බන්ධතා | 04 |

## 11.4 ලෝක මහා සංග්‍රාමය සහ ලෝක සමය සඳහා ප්‍රයන්ත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • යුද්ධයේ බිහිසුණු බව හා සාමයේ අර්ථවත් බව තුලනාත්මකව විමර්ශනය කරයි | • පළමුවන හා දෙවන ලෝක සංග්‍රාමය මානව සංහතියේ ඉදිරි ගමනට බාධාකාරී වූ ආකාරය විමර්ශනය කරමින් සංග්‍රාම තත්වයන්ගෙන් වැලකී සිටීමට කටයුතු කරයි.<br>• ජාතීන්ගේ සංගමයේ අසාර්ථ-කත්වය හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශක්තිමත්භාවය විග්‍රහ කරයි.<br>• පැසිස්ට්වාදයේ සහ නාසිවාදයේ ලක්ෂණ විමසා බලයි. | 11.4 ලෝක මහා සංග්‍රාමය සහ ලෝක සමය සඳහා ප්‍රයන්ත<br>11.4.1 පළමුවන ලෝක මහා සංග්‍රාමය<br>- හේතු<br>- ප්‍රධාන පාර්ශවකරුවන්<br>- ප්‍රතිඵල<br>11.4.2 ජාතීන්ගේ සංගමය හා ලෝක සාමය<br>- අරමුණු<br>- සාමය සඳහා ගත් ප්‍රයන්ත<br>- අසාර්ථකවීමට හේතු<br>11.3.2 පැසිස්ට්වාදයේ හා නාසිවාදයේ නැගීම<br>- පැසිස්ට්වාදය හැඳින්වීම<br>* මුසොලිනි යටතේ ඉතාලිය<br>- නාසිවාදය හැඳින්වීම<br>* හිට්ලර් යටතේ ජර්මනිය<br>11.4.4 දෙවන ලෝක මහා සංග්‍රාමය<br>- හේතු<br>- ප්‍රධාන පාර්ශව කරුවන්<br>- ප්‍රතිඵල<br>11.4.4 එක්සත් ජාතීන්ගේ සංවිධානය<br>- ආරම්භය<br>- අරමුණු<br>- ව්‍යුහය<br>- සාමය සඳහා ගත් ප්‍රයන්ත | 14 |

## 11.5 ලෝක බල තුලනය - දෙවන ලෝක යුද්ධයෙන් පසු

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ලෝක ඉතිහාසය ගොඩනැගීමට පාදක වූ දේශපාලන බලවේග පිළිබඳ තුලනාත්මකව විමර්ශනය කරයි. | • ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය ලෝක බලවතුන් ලෙස නැගී සිටි අයුරු තුලනාත්මකව විග්‍රහ කරයි | 11.5 ලෝක බල තුලනය - දෙවන ලෝක යුද්ධයෙන් පසු<br>11.5.1 ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු ලෙස නැගී සිටීම.<br>- නැගී සිටි ආකාරය<br>- ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වයට පත්වීම<br>11.5.2 සෝවියට් දේශය ලෝක බලවතෙකු ලෙස නැගී සිටීම<br>- හේතු<br>- සමාජවාදය පදනම්කර ගත් ආර්ථිකයක් ගොඩනැගීම<br>- සමාජවාදී කඳවුරේ නායකත්වයට පත්වීම. | 08 |
| | • එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරීත්වය අවි ගැටුම් සීමාවීමට හේතු වූ ආකාරය විග්‍රහ කරයි.<br>• සමාජවාදී කඳවුර විසිවන සියවසේ බිඳ වැටීමට හේතු වූ කරුණු විමර්ශනය කරයි. | 11.5.3 සීතල යුද්ධය<br>- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරීත්වය නිසා අවි ගැටුම් සඳහා අවස්ථාවක් නොමැති වීම<br>- බල කඳවුරු දෙකක් වශයෙන් ක්‍රියාත්මක වීම.<br>- ලෝක ආර්ථිකය පාලනය<br>- නොබැඳි ජාතීන්ගේ නැගීම<br>- සෝවියට් රුසියාවේ බිඳ වැටීම | 04 |

## 11.6 නිදහසින් පසු ශ්‍රී ලංකාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • නිදහසින් පසු දේශපාලන සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වී ඇති ආකාරය පිළිබඳව තුලනාත්මකව විමර්ශනය කරමින් ඉදිරි කටයුතු සැලසුම් කරයි | • පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ දී පක්ෂ ක්‍රමය හා කැබිනට් ක්‍රමයේ වැදගත්කම විමසයි. | 11.6 නිදහසින් පසු ශ්‍රී ලංකාව<br>11.6.1 පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය<br>- දේශපාලන පක්ෂ ක්‍රමය<br>- කැබිනට් ක්‍රමය | 04 |
| | • 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධන විග්‍රහ කරයි. | 11.6.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන<br>- ක්‍රි.ව. 1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව<br>- ක්‍රි.ව. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 04 |
| | • නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන උපාය මාර්ගයන් හි ඇති ඵලදායීතාව විමර්ශනය කරයි. | 11.6.3 නිදහසින් පසු සංවර්ධනය සඳහා ගත් ක්‍රියා මාර්ග<br>- අධ්‍යාපනය<br>- කෘෂි කර්මය<br>- රාජ්‍ය ව්‍යාවසාය<br>- කර්මාන්ත<br>- සමාජ සුභ සාධනය - සෞඛ්‍ය අධ්‍යාපනය, ප්‍රවාහන, සන්නිවේදනය | 08 |

# 11.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම

කාලච්ඡේද 20

හැඳින්වීම

ක්‍රි.ව. 1796 දී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ලන්දේසීන්ගෙන් පවරා ගත් ඉංග්‍රීසිහු 1815 දී මුළු රට ම තම ආධිපත්‍යයට යටත් කොට ගත්හ. ඉන් පසු සියවස් එකහමාරක පමණ කලක් මෙරට බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ පාලනය විය. ලංකාවේ තම ආධිපත්‍යය පතුරුවා ගැනීමට බ්‍රිතාන්‍යයන් ගෙන ගිය ක්‍රියාකලාපය කෙසේවී ද යන්න මෙම ඒකකයෙන් උගත හැකි ය.

බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට යටත් වූ ලාංකිකයන් සිය නිදහස උදෙසා දියත් කළ 1818 හා 1848 නිදහස් සටන් සඳහා පාදක වූ හේතු, එකී නිදහස් සටන් අසාර්ථක වීමට බලපෑ සාධක මොනවා ද යන්න මෙහි දී විමසීමක් කෙරේ. බ්‍රිතාන්‍ය බලය තහවුරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ සහ එමගින් මෙරට ඇති වූ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතිකමය ප්‍රතිඵල පිළිබඳ ව විමසා බැලීමක් සිදු කෙරේ.

නිපුණතා :
- ශ්‍රී ලංකාවේ බටහිර ජාතීන්ගේ බල ව්‍යාප්තිය සහ ඒ සමඟ ඇති වු සමාජ, දේශපාලන, ආර්ථික වෙනස්වීම් පිළිබඳ විමර්ශනය කරයි

නිපුණතා මට්ටම :
- පාලනයේ දුර්වලතා ප්‍රයෝජනයට ගනිමින් බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය විග්‍රහ කරයි.
- ස්වාධිපත්‍ය රැක ගැනීම සඳහා බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ස්වදේශිකයන් නැඟී සිටි ආකාරය විග්‍රහ කරයි.
- බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති කළ ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

විෂය සන්ධාරය

## 11.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම

### 11.1.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම

- අවස්ථා කිහිපයක දී සිදුවිය.
  1. 1796 මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම
  2. එම ප්‍රදේශ 1802 කිරීටයේ යටත් විජිතයක් බවට පත් කර ගැනීම
  3. 1815 උඩරට අත්පත් කර ගැනීම
  4. 1818 පළවෙනි නිදහස් සටන පරාජය කොට උඩරට ප්‍රදේශය ද බලය තහවුරු කර ගැනීම
  5. 1833 ප්‍රතිසංස්කරණය මගින් දේශපාලන, ආර්ථික, සමාජ ආදී ක්ෂේත්‍රවල පුළුල් වෙනස්කම් සිදු කොට ශ්‍රී ලංකවේ දේශීයත්වය යටත් කොට ඉංග්‍රීසි සභ්‍යත්වය මෙරට පිහිටුවීම.

- පෙරදිග වෙළෙඳ බලය ලබා ගැනීම සඳහා ක්‍රි.ව. 1600 දී බ්‍රිතාන්‍යයන් විසින් පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම පිහිටුවා ගැනීම.
- 1660 වනවිට පෙරදිග ඉන්දියා ප්‍රංශ වෙළෙඳ සමාගම පිහිටුවා ගත් ප්‍රංශ ජාතිකයන් ද පෙරදිග වෙළෙඳ තරගයට පිවිසීම.
- බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ හේතු.
  1. ලංකාව ඉන්දියන් සාගරයේ නැව් මාර්ගයන්හි මධ්‍යගතව පිහිටා තිබීම.
  2. ඊසාන දිග මෙන් ම නිරිත දිග මෝසම් සුළං කාලවල දී ආරක්ෂා සහිතව නැව් නවතා තැබිය හැකි ස්වභාවික වරායක් වූ ත්‍රිකුණාමල වරාය ලංකාවේ පිහිටා තිබීම.
  3. ඉන්දියාවේ බටහිර වෙරළේ මෙන් ම නැගෙනහිර වෙරළේ නාවුක බලය ලංකාවේ සිට පහසුවෙන් පාලනය කළ හැකි වීම.
  4. වෙළෙඳාමේ වැදගත්කම :
     * යුරෝපයට ගෙන ගිය කුරුඳු ප්‍රමුඛස්ථානයක් ගැනීම.
     * යුරෝපා රටවල් අතර පැවති වෙළෙඳ තරගයේ දී මෙරට කුරුඳු වෙළෙඳාමෙන් එතෙක් පෘගුගීසීන් හා ලන්දේසීන් ලැබූ ලාභය ඉංග්‍රීසීන් අතට පත් කර ගැනීම.
- 1789 ප්‍රංශ විප්ලවය ව්‍යාප්ත වී යාමත් සමග ප්‍රංශය යුරෝපයේ සෙසු රටවල් සමග යුද්ධයකට එළඹීම.
- 1794 දී ප්‍රංශය ඕලන්දය ආක්‍රමණය කරද්දී ඕලන්ද පාලකයා (ස්ටාට්හෝල්ඩ්ර් ) එංගලන්තයට පලා යාම.
- ප්‍රංශ ජාතිකයින්ට විරුද්ධව ලන්දේසීන්ට ආධාර දීමට ඉංග්‍රීසීන් ඉදිරිපත් වීම.
- ඒ නිසා ලංකාවේ ලන්දේසි ප්‍රදේශ ප්‍රංශ ජාතිකයින් පැහැර ගනිතැයි සැක මතුවීම.
- ස්ටැට්හෝල්ඩර්වරයා කියු මාලිගයේ සිට 1795 පෙබරවාරි 7 දා ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාරයාට කියු ලිපිය එවීම.
- කියු ලිපිය අනුව කටයුතු කිරීමට ෆන් ඈංගල්බෙක් ආණ්ඩුකාරයා අකමැති වීම.
- ඒ නිසා ඉංග්‍රීසීහු 1795 අගෝස්තු මාසයේ ද ලන්දේසීන්ට පහර දී ත්‍රිකුණාමලය අල්ලා ගත්හ. අනතුරුව පිළිවෙළින් යාපනය, මන්නාරම හා කල්පිටිය ද 1796 පෙබරවාරි 16 දින කොළඹ ද අත්පත් කර ගත්හ.
- එදින ඈංගල්බෙක් ආණ්ඩුකාරතුමා ලන්දේසීන් සතුව තිබූ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට පවරා දීමේ ගිවිසුමකට අත්සන් කළේ ය.
- ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට පවරා දෙනු ලැබූ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ එම සමාගමේ මදුරාසි පාලන මධ්‍යස්ථානය මගින් පාලනය කිරීම ඇරඹීම.

- ඉන්දියාවේ බදු එකතු කිරීමේ දී අනුගමනය කළ ක්‍රම ඒ ආකාරයෙන් ම ලංකාවේ ද අනුගමනය කිරීමට මදුරාසි පාලකයින් තීරණය කිරීම
- මුහුදු බඩ ප්‍රදේශ පරිපාලන ඒකක තුනකට බෙදීම. එම ප්‍රදේශය පාලනයට පත්කළ නිලධාරියාගේ කාර්යාලය කච්චේරිය නම් විය.
- එයින් ශ්‍රී ලංකාවේ කච්චේරි පාලන ක්‍රමය ආරම්භ විය.
- දේශීය නිලධාරීන් තනතුරුවලින් පහකොට බදු එකතු කිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් අවුමිල්දාර් නමින් හැඳින් වූ නිලධාරීන් ගෙන ඒම.
- මුදලින් බදු ගෙවිය යුතු වීම.
- පොල්, අරක්කු, මාළු, ලුණු රා සහ දුම්කොළ ආදිය සඳහා නව බදු පැනවීම.
- බදු එකතු කිරීමේ අයිතිය පැවරීමේ දී වෙන්දේසි කිරීමේ ක්‍රමයක් අනුගමනය කිරීම.
- අවුමිල්දාර්වරුන්ගේ පාලනය හා නව බදු පැනවීම නිසා පීඩාවට පත් මුහුදුබඩ ප්‍රදේශවල ජනතාව වෙළෙඳ සමාගමේ පාලනයට විරුද්ධව 1797 දී කැරැල්ලක් ඇති කිරීම.
- 1797 කැරැල්ලට හේතු
    1. බදු එකතු කිරීමේ කටයුතු සඳහා දේශීය නිලධාරීන් වෙනුවට මදුරාසි නිලධාරීන් යෙදවීම.
    2. මදුරාසි නිලධාරීන් තාඩන පීඩන කොට බදු එකතු කිරීම
    3. මුදල් භාවිතයක් නොපැවති එකල මුදලින් පමණක් බදු අය කිරීම මහජනතාවට පීඩාකාරී වීම.
    4. නව බදු කිහිපයක් පැනවීම උදා : පොල් බද්ද, මාළු, ලුණු හා අරක්කු සඳහා පැනවූ බදු.
    5. මුහුදුබඩ, ප්‍රදේශවල වැසියා මුහුණ දුන් හිරිහැර පිළිබඳ මදුරාසි නිලධාරීන්ට පැමිණිලි කළ ද සාධාරණයක් ඉටු නොවීම.
- මදුරාසි පාලනය ගැන කළකිරුණු ජනයා 1797 දී ඉංග්‍රීසීන්ට එරෙහි ව කැරළි ගැසීම.
- සිංහලයන් ගරිල්ලා සටන් ක්‍රම අනුගමනය කිරීම, ප්‍රදේශයක කිහිපයක කැරලි පැන නැගීම හා ගමනාගමන දුෂ්කරතා නිසා කැරැල්ල මැඩලීමේ දී ඉංග්‍රීසීන් දුෂ්කරතාවලට මුහුණ දීම
- කැරැල්ලට හේතු සොයා බැලීමට කර්නල් ද මියුරන් ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම
- ද මියුරන්ගේ නිර්දේශ වූයේ
    1. බදු වෙන්දේසි ක්‍රමය අහෝසි කිරීම
    2. බදු එකතු කිරීම සඳහා මදුරාසි නිලධාරීන් වෙනුවට දේශීය නිලධාරීන් පත් කිරීම
    3. පොල් බද්ද වැනි නව බදු අවලංගු කිරීම
    4. ලන්දේසි උසාවි යළි පිහිටුවීම

- මදුරාසි සමාගමේ පාලන දුර්වලකම් පැහැදිලි වූයෙන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම සඳහා 1798 ඔක්තෝබර් මස බ්‍රිතාන්‍ය රජය ද එකතු විය. ඒ අනුව සමාගම සහ කිරීටය එකතුව ක්‍රියාත්මක කළ ආණ්ඩු ක්‍රමය "ද්විත්ව ක්‍රමය" ලෙස හැඳින්වේ.
- ප්‍රථම ආණ්ඩුකරයා ලෙස ප්‍රෙඩ්රික් නෝර්ත් පත්කර එවීම.
- ද්විත්ව පාලන ක්‍රමය යටතේ නෝර්ත් ආණ්ඩුකාරවරයාට සමාගම සහ කිරීටය යන ස්වාමිවරුන් දෙදෙනෙකුට වගකීමට සිදුවීම.
- ප්‍රංශ විප්ලවය සමඟ ඇරඹි යුරෝපා යුද්ධය අවසන් වී 1802 දී එමියන්ස් සාම ගිවිසුම අත්සන් කිරීම. යුද්ධ සමයේ ලන්දේසීන්ගෙන් අල්ලා ගෙන තිබූ ප්‍රදේශ ඔවුන්ට ආපසු දීමට සිදුවෙනු ඇතැයි සිතූ අවිනිශ්චිත බව පහවීම. ඒ අනුව එතෙක් ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතේ පැවති ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතට පවරා ගැනීම.

1815 උඩරට යටත් කර ගැනීම

- 1815 ට පෙර උඩරට යටත්කර ගැනීමට ප්‍රයත්න කිහිපයක් දැරීම
- ක්‍රි.ව. 1800 දී මැක්ඩෝවෙල් සෙනෙවියා යටතේ උඩරටට සේනාවක් යවා උඩරට රජු සමඟ ගිවිසුමකට එළඹීමට නෝර්ත් ආණ්ඩුකාරවරයා උත්සාහ ගත්ත ද එය අසාර්ථක වීම.
- 1803 දී උඩරට ආක්‍රමණය කිරීමට නෝර්ත් ආණ්ඩුකාරයා තීරණය කිරීම
- ක්‍රි.ව. 1803 උඩරට ආක්‍රමණයට බලපෑ හේතු.
    1. මුහුදුබඩ ප්‍රදේශයේ ආරක්ෂාව පතා වෙරළබඩ හා උඩරට රාජ්‍ය දේශ සීමාවේ හමුදා කණ්ඩ දෙකක් නඩත්තු කිරීමට සිදුවීම.
    2. උඩරටට පිවිසෙන කඩවත්වල දී බදු ගෙවීමට සිදු වීම.
    3. මුහුදුබඩ ප්‍රදේශවල වැසියා විසින් උඩරට රජු තමාගේ ද රජු ලෙස පිළි ගැනීම.
    4. පාලන මධ්‍යස්ථානය වූ කොළඹ හා ත්‍රිකුණාමලය අතර සම්බන්ධතා පැවැත්වීමේ අපහසුව.
    5. ඉංග්‍රීසීන් පලවා හැරීමට උඩරට රජු ප්‍රංශ හමුදා ආධාර ලබා ගනිතැයි තිබූ සැකය.
    6. පිළිමතලාවේ උඩරට රජුවීමට නෝර්ත් ආණ්ඩුකාරයාගෙන් ආධාර ඉල්ලා සිටීම.
    7. පහතරට වෙළෙඳුන්ට හිරිහැර කිරීමේ සිද්ධිය
- ක්‍රි.ව. 1803 ජනවාරියේ දී සේනාපති මැක්ඩොවල් ගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කිරීම.
- කොළඹින් හා ත්‍රිකුණාමලයෙන් එකවර සේනා දෙකක් උඩරට බලා ගමන් ඇරඹීම.
- ඉංග්‍රීසි සේනා උඩරටට ළඟා වන විට රජු මහනුවර අතහැර පලා යාම.

- මැක්ඩොවල් සෙනෙවියා විසින් උඩරටට කැඳවා ගෙන යන ලද මුත්තුසාමි උඩරට රජ කරවීම.
- ඉංග්‍රීසින්ට අවශ්‍ය පරිදි මුත්තුසාමි උඩරට රජු ලෙස ප්‍රකාශ කොට ඔහු හා ගිවිසුමකට එළඹීම.
- මුත්තුසාමිගේ ආරක්ෂාවට ඉංග්‍රීසි සේනාංකයක් නවතා ඉංග්‍රීසින් ආපසු යාම.
- මෙතෙක් සැගව සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිය ප්‍රතිප්‍රහාර ආරම්භ කිරීම.
- උඩරට සිංහලයන්ගේ ගරිල්ලා ප්‍රහාර හමුවේ ඉංග්‍රීසීන් අන්ත පරාජයට පත්වීම.
- 1805 දී ලංකාවට පත්ව ආ තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා ජයග්‍රාහී උඩරට ආක්‍රමණයක් දියත් කිරීම සඳහා පසුබිම සැකසීම.
- ඒ සඳහා ජෝන් ඩොයිලි ආණ්ඩුකාරයාට උපකාර කිරීම.
- උඩරට රදලයන්ගේ බලය වර්ධනය වී තිබූ බැවින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු රදල බලය මැඩලීමට පියවර ගැනීම සහ ඉංග්‍රීසීන් එයින් ප්‍රයෝජන ගැනීම.
    1. රජ මාලිගයේ ඉහළ තනතුරු නායක්කාර වංශිකයන්ට දීම.
    2. සිංහල රදළයන් භේද කිරීමට පියවර ගැනීම.
    3. සිංහල රදලයන්ගේ වැරදි සඳහා දැඩි දඩුවම් දීම.
- 1810 දී පිළිමතලාවේගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මැරවීමට කුමන්ත්‍රණය කිරීම සහ එය හෙළිවීම නිසා රජු පිළිමතලාවේ මැරවීම.
- ඇහැලේපොළ මහඅදිකාරම් ධුරයට පත්වීම.
- ඇහැලේපොළට සබරගමුව දිසාවේ තනතුර ද පැවරීම.
- ඉංග්‍රීසි ආධාර බලාපොරොත්තුවෙන් ඇහැලේපොළ සබරගමුවේ කැරැල්ලක් ඇති කිරීම.
- උඩරට රජු ඇහැලේපොළ බිරිඳ හා දරුවන් දළදා මාලිගා බිමේ දේවසංහිඳ නම් ස්ථානයේ දී මැරවීම.
- ඇහැළපොල පවුල් ඝාතන සිද්ධියත් සමග උඩරට රජු කෙරෙහි භික්ෂූන් වහන්සේලා රදලයන් හා මහජනතාවගේ අප්‍රසාදය වඩාත් වර්ධනය වීම.
- 1814 දී උඩරටට ගිය වෙළෙඳ කණ්ඩායමකට චරපුරුෂයන් යයි සැකකොට වධ හිංසා පැමිණවීම.
- රජුට විරුද්ධවූ කැරලිකරුවන් පිරිසක් පසුපස හඹා ආ උඩරට රජුගේ භටයන් , බ්‍රිතාන්‍යයන්ට අයත් ප්‍රදේශයේ ගමකට ගිනි තැබීම.
- ඉංග්‍රීසි හමුදාව උඩරට බලා ගමන් කිරීම.
- අවසන් මොහොතේ දී මොල්ලිගොඩ ඉංග්‍රීසින්ගේ පක්ෂයට එක්වීම.
- පලා ගිය උඩරට රජු මැද මහනුවර බෝමුරේ උඩුපිටිය ආරච්චිගේ නිවසේ සැඟවීම.
- සිංහල නායකයින් විසින් උඩරට රජු අල්ලා ඉංග්‍රීසි හමුදාවට භාරදීම
- 1815 මාර්තු 2 දින උඩරට මගුල් මඩුවේ දී උඩරට ගිවිසුම අත්සන් කිරීම.
- එමඟින් උඩරට රාජ්‍ය ඉංග්‍රීසීන්ට පාවා දීම.

11.1.2 බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර

- 1797 - 1798 මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල ( ඉහත විස්තර කෙරිණ)
- 1818 පළමු නිදහස් සටන
  - 1818 නිදහස් සටනට බලපෑ හේතු.
    1. දුර බැහැර වාසය කළ නිතර දෙවේලේ නොදකින රජෙකුට යටත්වීම උඩරැටියන්ට නුපුරුදු දෙයක්වීම.
    2. උඩරට රදළයන්ට ඉංග්‍රීසි නිලධාරීන්ට යටත්ව සිටීමට සිදුවීම.
    3. කඩවත් බදු අහෝසි කිරීම නිසා රදළයන්ගේ ආදායම අඩුවීම.
    4. ඉංග්‍රීසීන් උඩරට ගිවිසුමට අනුව පාලන කටයුතු සිදු නොකිරීම.
    5. උසස් නිලතල සිංහල පවුල්වලට ලබාදීමේ සම්ප්‍රදායට පටහැනිව වෙල්ලස්සට හජ්ජි මරික්කාර් නැමැති මුස්ලිම් මුහන්දිරම්වරයකු පත් කිරීම.
    6. තමාට රජකමේ උරුමය ඇතැයි කී විල්බාවේ දොරේසාමි භික්ෂූන් වහන්සේලා පිරිවරාගෙන උඩරට රාජ්‍යයේ සැරිසැරීම.
- 1817 ඔක්තෝබර් 12 වන දින ඌව වෙල්ලස්සේ දී පළමු නිදහස් සටන ආරම්භ වීම.
- 1818 නිදහස් සටනේ නායකත්වය දැරුවේ
  1. මොනරවිල කැප්පෙටිපොළ
  2. මඩුගල්ලේ
  3. කිවුලේගෙදර මොහොට්ටාල
  4. බූටෑවේ රටේ රාළ
- දරුණු ක්‍රියා මාර්ග මගින් සටන් මර්ධනය කොට පරාජය කිරීම
- කැරළි නායකයින් වූ කැප්පෙටිපොළ හා මඩුගල්ලේ රාජද්‍රෝහීන් ලෙස සලකා මහනුවර බෝගම්බරදී හිස ගසා මරණයට පත් කිරම
- අනෙකුත් නායකයන් රටින් පිටුවහල් කිරීම, දේපොළ රාජ සන්තක කිරීම
- 1818 පළවෙනි නිදහස් සටන් අසාර්ථක වීමට හේතු.
  1. සටන මැනවින් සංවිධානය වී නො තිබීම.
  2. දළදාව ඉංග්‍රීසීන් සතුවීම.
  3. රදළයන් අතර වූ පෞද්ගලික එදිරිවාදිකම්.
  4. ඉංග්‍රීසීන් අනුගමනය කළ ගම්බිම් විනාශ කිරීමේ ප්‍රතිපත්තිය - බිම්පාළු ප්‍රතිපත්තිය.
  5. දොරේසාමි සිහසුනෙහි උරුම කරුවෙකු නොවන බව සහ ඔහු විල්බාව ගමේ පැවිදි පුද්ගලයකු බව හෙළිවීම.
- 1818 යුධ ජයග්‍රාහකයන් ලෙස බ්‍රිතාන්‍යයන් තම අභිමතය පරිදි 1818 ප්‍රකාශය නිකුත් කිරීම.

- එම ප්‍රකාශය අනුව රදළවරුන්ගේ බලතල අඩු කිරීම.

  උදා : I උඩරට දේශීය නිලධාරීන්ට සුළු මුලාදෑනීන් පත් කිරීමට තිබූ බලය අහෝසි කිරීම.

  II උඩරට රදලයින් බ්‍රිතාන්‍යයන්ගෙන් වැටුප් ලබන පිරිසක් බවට පත් කිරීම.

  III උඩරට දේශීය නිලධාරීන්ට මහජනයාගෙන් දැකුම් පඬුරු ලබා ගැනීමට අවසර නැති බව ප්‍රකාශ කිරීම.

  IV තවත් වගන්තියකට අනුව ආණ්ඩුකාරයාගේ අවසරය ඇතිව උඩරට වෙනත් ආගම් ප්‍රචාරයට ඉඩ ලබා දීම.

  V ඉංග්‍රිසීන්ගේ උසාවි ක්‍රමය උඩරට ප්‍රදේශවල පිහිටුවීම ද මෙම ප්‍රකාශය අනුව සිදු කරන ලදී.

1848 දෙවන නිදහස් සටන

- කෝල්බෲක් කොමිසමේ නිර්දේශය පරිදි 1833 ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල 1848 දෙවන නිදහස් අරගලයට පසුබිම සැකසී ය.
- 1848 නිදහස් අරගලයට මුල් වූ සාධක

  1. සිවිල් සේවකයන් සංඛ්‍යාව අඩු කිරීම නිසා සිවිල් සේවය බිඳ වැටීම.
  2. දේශීය කෘෂිකාර්මික කටයුතුවලට රජයේ අනුග්‍රහය නොලැබීම.
  3. දිස්ත්‍රික් උසාවි ක්‍රමයෙන් ගැමියා පීඩාවට පත්වීම.
  4. ස්ටුවර්ට් මැකෙන්සි ආණ්ඩුකාරයා විසින් 1840 පනවන ලද මුඩුබිම් ආඥා පනත යටතේ ගොවි ජනතාවට බොහෝ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීම.
  5. බුදු දහමට රජයේ අනුග්‍රහය ලබාදීම අත්හැරීම.
  6. ටොරින්ටන් ආණ්ඩුකාරයා විසින් නව බදු පැනවීම.
  7. නිල් පොත නැමැති සංඛ්‍යා ලේඛන සංග්‍රහයට කරුණු රැස් කිරීම, එය නව බදු සඳහා තොරතුරු එක් රැස් කිරීමක් ලෙස ප්‍රචාරය වීම.
- උඩරැටියන් බ්‍රිතාන්‍ය පාලකයින්ට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ගිය අවස්ථාවේ ඇති වූ කලබලකාරී තත්ත්වය හමුවේ ආණ්ඩුකාරයා යුද්ධ නීතිය පනවා වැසියා මර්දනය කිරීම.
- මාතලෙන් ඇරඹි සටන මහනුවර, දඹුල්ල, වාරියපොළ, හා කුරුණෑගල යන ප්‍රදේශයන්හි ශීඝ්‍රයෙන් පැතිර යාම.
- වීර පුරන්අප්පු, ගොන්ගාලේගොඩ බණ්ඩා, හඟුරන්කෙත ඩිංගිරිරාල කුඩාපොළ හිමි යන අය සටන සංවිධානය කිරීම.

- 1848 සටන අසාර්ථකවීමට හේතු.

    1. සටන මනාව සංවිධානය වී නොතිබීම හා අත්දැකීම් මදබව.
    2. උඩරට පුරා සතුටුදායක මාර්ග පද්ධතියක් පැතිර තිබීම.
    3. ඉංග්‍රීසීන්ට අවශ්‍ය අවස්ථාවේ දී අතිරේක සේනා ලැබීම.

- 1848 සටනේ ප්‍රතිඵල

    1. වැරදිකරුවන් බව ඔප්පු වූ අයට දඬුවම් දීම හා දේපල රාජසන්තක කිරීම.
    2. ටොරින්ටන් ආණ්ඩුකාරයා ආපසු කැඳවීම.
    3. විරෝධයට ලක් වූ බදු වර්ග සංශෝධනය කිරීම.
    4. වාරි මාර්ග හා කෘෂිකාර්මික කටයුතු දියුණුවට රජයේ අනුග්‍රහය ලබා දිය යුතු බව බ්‍රිතාන්‍ය පාලකයන් අවබෝධ කර ගැනීම.
    5. දේශීය කෘෂිකර්මය නගා සිටුවීමට, සනීපාරක්ෂක කටයුතු දියුණු කිරීමට, වතු වගාවට අවශ්‍ය මාර්ග ඉදි කිරීමට සහ ප්‍රදේශීය සහ පළාත් පාලන කටයුතු වැඩි දියුණු කිරීමට 1852න් පසුව පාලකයන්ට නියම කිරීම.

       උදා : 1865 - මහ නගර සභා පිහිටුවීම
       1871 ගම් සභා පිහිටුවීම

11.1.3 ආණ්ඩුක්‍රම විකාශය හා පරිපාලනය 1947 දක්වා

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ

- ක්‍රි.ව. 1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා මෙරට ක්‍රියාත්මක වීම.
- ශ්‍රී ලංකාවේ අයවැය ලේඛනයේ දිගින් දිගට ම මතු වූ හිඟය පියවා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කොල්බෲක් කොමිසම පත් කිරීම.
- 1829 දී පැමිණි කෝල්බෲක් ශ්‍රී ලංකාවේ පරිපාලනය, ආදායම, රාජ්‍ය ආයතන හා රාජකාරී ක්‍රමය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම. 1830 දී පැමිණි චාල්ස් හේ කැමරන් අධිකරණ කටයුතු පිළිබඳ යෝජනා ඉදරිපත් කිරීම.
- කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ යෝජනා
    1. උඩරට හා පහතරට ප්‍රදේශ එක් කොට ඒකීය පාලන ක්‍රමයක් ඇති කිරීම.
    2. පළාත් 16 බෙදා තිබූ ශ්‍රී ලංකාව පළාත් 5කට බෙදීම.
    3. සිවිල් සේවකයන්ගේ වැටුප් අඩු කිරීම හා විශ්‍රාම වැටුප් අවලංගු කිරීම.

4. අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අවලංගු කිරීම.
5. ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම.
6. රජයේ වෙළෙඳ ඒකාධිකාරය අවලංගු කර නිදහස් වෙළෙඳාම ඇති කිරීම.
7. ව්‍යාවස්ථාදායක හා විධායක සභාව පිහිටුවීම.
8. මුළු රටට ම පොදු ඒකාකාර අධිකරණ ක්‍රමයක් හඳුන්වාදීම සහ එහි පහළ ම උසාවිය ලෙස දිස්ත්‍රික් උසාවි ක්‍රමය ඇති කිරීම.

- මන්ත්‍රීවරුන් 15 යුතු ව්‍යාවස්ථාදායක මන්ත්‍රණ සභාවේ නිල ලත් මන්ත්‍රීවරුන් 9 ක් ද, නිල නොලත් මන්ත්‍රීන් 6 ක් ද වීම.
  1. නිල නොලත් මන්ත්‍රීන් ආණ්ඩුකාරයා විසින් නාමකරණයෙන් පත් කිරීම.
  2. ඔවුන් ජාතීන් අනුව පත් කිරීම.
  3. ව්‍යාවස්ථාදායක සභාව
     - නිල ලත් 9
     - නිල නොලත් 6
       - බර්ගර් 1
       - සිංහල 1
       - දෙමළ 1
       - යුරෝපීය 3
- 1840 සිට ම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා උද්ඝෝෂණ ඇතිවීම සහ යුරෝපීයයන් ඒවායේ පෙරමුණ ගැනීම.
- 20 වන සියවසේ ආරම්භය වනවිට ස්වදේශිකයන්ගේ පුරෝගාමීත්වයෙන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා වූ උද්ඝෝෂණ ගෙන යාමට සංවිධාන පිහිටුවා ගැනීම.
  1. ලංකා ජාතික සංගමය
  2. හලාවත සංගමය
  3. යාපන සංගමය
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණය කළ අයගේ ප්‍රධාන ඉල්ලීම් වූයේ
  1. නිල නොලත් සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම.
  2. පළාත්බද නියෝජන ඇති කිරීම.
  3. ව්‍යාවස්ථාදායක සභාවේ බලතල වැඩි කිරීම.
  4. විධායක සභාවට නිල නොලත් සාමාජිකයින් පත් කිරීම

මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

- 1910 මැකලම් ආණ්ඩුකාරවරයා ගේ සමයේ දී මේ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් විය.
- 1912 දී මෙම ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක වීම.
- ව්‍යාවස්ථාදායක මන්ත්‍රණ සභාවේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩවීම. නිලලත් සමාජික සංඛ්‍යාව 11ක් ද නිල නොලත් සමාජික සංඛ්‍යාව 10 ක් ද වීම.

- ලාංකිකයන්ගෙන් 4%ට සීමිත ඡන්ද බලයක් හිමිවීම.
- ඉංග්‍රීසි, මධ්‍යම පන්තික, උගත් ලාංකිකයන්ට පමණක් ඡන්ද බලය හිමිවීම
- පොන්නම්බලම් රාමනාදන් උගත් ලාංකිකයින්ගේ ඡන්ද බලයෙන් ව්‍යාවස්ථාදායක මන්ත්‍රණ සභාවට තේරී පත් වූ අතර ඔහු ඡන්ද බලයෙන් එම සභාවට තේරී පත් වූ ප්‍රථම ලාංකිකයා වීම.
- මැකලම් ප්‍රතිසංස්කරණ යෝජනාවන්ගෙන් ලාංකික උද්ඝෝෂකයන් තෘප්තිමත් නොවීම.
- 1915 සිංහල මුස්ලිම් කෝලාහලය මර්දනයට රොබට් චාමස් ආණ්ඩුකාරයා දැඩි පියවර ගැනීම.
- 1919 ලංකා ජාතික සංගමය පිහිටුවීම.
- ලංකා ජාතික සංගමය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණයන්හි පෙරමුණ ගැනීම.

මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

- 1921 දී මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක විය.
- 1921 ව්‍යාවස්ථාදායක මන්ත්‍රණ සභාවේ නිලලත් සාමාජික සංඛ්‍යාව 14 දක්වා ද නිල නොලත් සමාජික සංඛ්‍යාව 23 දක්වා ද වැඩිවීම.
- ප්‍රථම වරට ව්‍යාවස්ථාදායක සභාවේ නිල නොලත් මන්ත්‍රීන් සංඛ්‍යව බහුතරයක් වීම.
- ප්‍රථම වතාවට පළාත් බද නියෝජන ක්‍රමය ක්‍රියාත්මක වීම.
- විධායක සභාවට ලාංකිකයන් තිදෙනෙකු පත් කිරීම.

1924 මැනිං - ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

- 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යාවස්ථාදායක මන්ත්‍රණ සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව 37 දක්වා ද නිලලත් මන්ත්‍රීන් සංඛ්‍යාව 12 දක්වා ද වෙනස් වීම.
- 1924 ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාවේ බලය හා වගකීම වෙන්ව පැවතීම ප්‍රධාන දුර්වලතාව වීම.

  උදා : පාලන කටයුතු පිළිබඳ වගකීම ආණ්ඩුකාරයාට පැවරී තිබූ අතර ව්‍යාවස්ථාදායක මණ්ඩලයේ බහුතර බලය නිල නොලත් මන්ත්‍රීන්ට පැවරී තිබිණ. එහෙත් ඔවුන්ට වගකීමක් පැවරී තිබුණේ නැත.

ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

- 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා කෙරෙහි ලාංකික උගත් මධ්‍යම පන්තිය සතුටු නොවීම.
- මෙම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා නිසා මෙකළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ හියු ක්ලිෆර්ඩ් නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බව යටත් විජිත ලේකම්ට දන්වා යැවීම.

- නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම සඳහා 1927 දී ඩොනමෝර් සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් කොමිසමක් ලංකාවට පත්කර එවීම.
- ඩොනමෝර් කොමිසම ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීම.
- 1931 - 1947 දක්වා ක්‍රියාත්මක වූ ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනාවන් හි දුර්වලතා.
    1. ආණ්ඩුකාරයාට හා රාජ්‍ය නිලධාරීන්ට තිබූ බල තල.
    2. දේශීය ජනතාවට ලැබුණේ අර්ධ වගකීම් සහිත පාලක ක්‍රමයක් වීම.

සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

- පූර්ණ වගකීම් සහිත පාලන ක්‍රමයක් ලබා දෙන ලෙස ඉල්ලා ලාංකිකයන් ගෙන ගිය උද්ඝෝෂණයන්හි ප්‍රතිපලයක් වශයෙන් 1944 දී සෝල්බරි කොමිසම මෙරටට පත්කර එවීම.
- සෝල්බරි කොමිසම ඉදිරිපත් කළ යෝජනාවන්ට බොහෝ දුරට පදනම් වූයේ ලාංකික ඇමතිවරු ඉදිරිපත් කළ ආණ්ඩුක්‍රම කෙටුම්පත් පණත නමින් හැඳින්වෙන යෝජනා මාලාව වීම.
- 1947 දී ක්‍රියාත්මක වූ සොල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන අංග වූයේ
    1. ආණ්ඩුකාර පදවිය ඇති කිරීම.
    2. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවක් ඇති කිරීම.
    3. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් පිහිටුවීම.
    4. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අධිකරණ සේවා කොමිෂන් සභාව ඇති කිරීම.
- ආණ්ඩුකාරවරයා නාමමාත්‍ර විධායකයා වීම.
- පාර්ලිමේන්තු නියෝජිත මන්ත්‍රී මණ්ඩලය නියෝජිතයන් 101 යුතු වීම. ඉන් 95 සර්වජන ඡන්දයෙන් ද මන්ත්‍රීවරුන් 6 නාමකරණයෙන් ද පත්වීම. එහි සේවා කාලය වසර පහක් වීම.
- උත්තර මන්ත්‍රී මණ්ඩලය ( සෙනට් මන්ත්‍රී මණ්ඩලය) සභිකයින් 30 දෙනෙකුගෙන් යුක්ත වීම.
- විධායක කටයුතු අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට පැවරීම
- රාජ්‍ය සේවාවේ හා අධිකරණ සේවාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම කටයුතු කිරීම.
- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව 1947 දී මහ මැතිවරණය පැවැත්වීම.
- 1947 මහ මැතිවරණයේ දී වැඩිම ආසන සංඛ්‍යාවක් දිනා ගත් එක්සත් ජාතික පක්ෂය මෙරට ප්‍රථම ආණ්ඩුව පිහිටුවීම.
- ඩී.එස්.සේනානායක මහතා මෙරට ප්‍රථම අගමැති වීම.
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පරිපාලන ක්‍රමය අධිරාජ්‍යවාදී පාලන රටාවකට අනුව සැකසී තිබීම.

- ලංකාවේ පරිපාලන සැකස්ම

බ්‍රිතාන්‍ය රජතුමා

↓

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව

↓

යටත් විජිත භාර ලේකම්

↓

බ්‍රිතාන්‍ය ආණ්ඩුකරු

↓

විජිතයේ ලේකම්
(ප්‍රධාන ලේකම් )

↓

සිවිල් නිලධාරීන්

↓ ↓

දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඒජන්තවරුන්

↓ ↓

දේශීය නිලධාරීන් දේශීය නිලධාරීන්

යනුවෙන් සංවිධානය වී පැවතීම.

- 1798 වසරේදී ලංකාවේ සිවිල් සේවාවේ ආරම්භය සිදුවීම.
- මධ්‍යම ආණ්ඩුවේ කටයුතු දෙපාර්තමේන්තු පදනම් කොට ගෙන ක්‍රියාත්මක වීම.
- නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ සමයේ නව දෙපාර්තමේන්තු කීපයක් ආරම්භ කිරීම.

  උදා : 1800 - මානක දෙපාර්තමේන්තුව
  1800 - ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව
  1801 - ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්මේන්තුව
- 1805 - 1811 දක්වා මුහුදුබඩ ප්‍රදේශවල ආණ්ඩුකාරයා වූ තෝමස් මේට්ලන්ඩ් ලංකාවේ ක්‍රමවත් සිවිල් සේවයක් ඇති කිරීමට පියවර ගැනීම.

  උදා : සෑම සිවිල් සේවකයකයෙකුට ම ස්වදේශීය භාෂාවක් ප්‍රගුණ කිරීමට නියම කිරීම
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ දෙපාර්තමේන්තු පාලනය තවදුරටත් ක්‍රමවත් කිරීමට පියවර ගැනීම
- පරිපාලන ප්‍රදේශ 16 බෙදා තිබූ ශ්‍රී ලංකාව කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ පරිපාලන ප්‍රදේශ පහ දක්වා අඩු කිරීම.
- කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ මගින් වියදම අඩු කර ගැනීමේ මාර්ගයක් ලෙස සිවිල් සේවක වැටුප අඩු කොට විශ්‍රාම වැටුප අහෝසි කිරීම.

- නව ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන පරිපාලන ඒකක අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල වීම හා සිවිල් සේවක වරප්‍රසාද අඩු කිරීම නිසා මෙරට සිවිල් සේවය අකාර්යක්ෂම වීම.
- බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය යටතේ ග්‍රාමීය ප්‍රදේශ නොසලකා හැරීමක් සිදුවීම.
- ඒ බව අවබෝධ කර ගත් ආණ්ඩුකාරවරු වරින් වර පලාත් සංඛ්‍යාව වැඩි කිරීම.

  උදා : වයඹ පලාත
  උතුරු මැද පළාත
  ඌව පළාත
  සබරගමු පළාත

- ප්‍රාදේශීය පාලන කටයුතු කච්චේරිය පදනම් කොට ගෙන ක්‍රියාත්මක විය.
- ප්‍රාදේශීය පාලන සැකස්ම

  ඒජන්තවරු - කච්චේරිය
  ↓
  උප ඒජන්තවරු
  ↓
  ග්‍රාම නිලධාරීන්

- පළාත් පාලන කටුයතු සඳහා වූ ආයතනයන් ද බ්‍රිතාන්‍ය පාලනය යටතේ ආරම්භ වීම.

  උදා : 1865 - මහ නගරසභා ඇරඹීම
  1871 - ගම්සභා පිහිටුවීම
  1897 - සුළු නගරසභා ඇරඹීම

# 11.2 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික වෙනස්වීම්

කාලච්ඡේද 16

## හැඳින්වීම

ලන්දේසීන් යටතේ තිබූ ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් විසින් ක්‍රි.ව. 1796 දී අත්පත් කර ගත් අතර ක්‍රි.ව. 1815 දී උඩරට රාජ්‍යය ද යටත් කර ගැනිණ. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලබා ගන්නා තෙක් කාලය තුළ මෙරට බ්‍රිතාන්‍ය පාලනය යටතේ සිදු වූ සමාජ හා ආර්ථික වෙනස්වීම් පිළිබඳ තොරතුරු මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

බ්‍රිතාන්‍යයන් විසින් අනුගමනය කරන ලද ධනවාදී ආර්ථික ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකාවේ වතු වගාව ව්‍යාප්ත වූ ආකාරය සහ එමඟින් පාරම්පරික කෘෂිකර්මය අඩපන වූ ආකාරය ද අධ්‍යයනය කෙරේ. එසේ ම බ්‍රිතාන්‍යයන් මෙරට අනුගමනය කළ පාලන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා දේශීය පාලකයන් ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාර පිළිබඳව ද මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කරනු ලැබේ.

දේශපාලන අංශය කෙරෙහි පමණක් නොව සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු ජන කොටස් ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයක් ඇති කිරීම කෙරෙහි උනන්දු වූ ආකාර ද අධ්‍යයනය කරනු ඇත.

නිපුණතාව :

- ශ්‍රී ලංකාවේ බටහිර ජාතීන්ගේ බල ව්‍යාප්තිය සහ ඒ සමඟ ඇති වූ සමාජ ආර්ථික වෙනස්කම් පිළිබඳ විමරශනය කරයි.

නිපුණතා මට්ටම :

- වතු වගාවේ ව්‍යාප්තිය නිසා ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් විමර්ශනය කරයි.
- බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ සමාජය තුළ ඇති වූ වෙනස්කම් විග්‍රහ කරයි.
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ඇති වූ අධ්‍යාපනික වෙනස්වීම් පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.
- බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය විමර්ශනය කරයි.

විෂය අන්තර්ගතය

## 11.2 බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික වෙනස්වීම

### 11.2.1 ඉඩම් භුක්තිය හා අනිවාර්ය සේවා රාජකාරිය අවලංගු කිරීම

- අතීතයේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය සැකසුණු ආකාරය පැහැදිලි කිරීම
    - ඉඩම්වල අයිතිකරු රජු වීම.
    - රාජ්‍ය සේවය වෙනුවෙන් නිලධාරීන්ට වේතන වෙනුවට ඉඩම් දීම.
    - නිලධාරීන් එම ඉඩම් වගා කිරීමට සාමාන්‍ය ජනතාව යොමු කිරීම.
    - එසේ සාමාන්‍ය ජනතාව භුක්තිවිදින ලද ඉඩම්වල අයිතිකරුවන් වූ රජයට හා ප්‍රභූවරුන්ට ජනතාව විසින් ඉඩම් බදු ගෙවීම.
    - ඒ සමඟ ම අනිවාර්ය රාජකාරී සේවය ද ඉටු කිරීම.
    - ඒ අනුව සෑම වැඩිහිටි පිරිමියෙක් ම වසරකට නියමිත දින ගණනක් අනිවාර්යයෙන් ම නොමිලේ රජුට සේවය කළ යුතු වීම.
- ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයා දේශීය ඉඩම් භුක්ති ක්‍රමය මෙන් ම අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අවලංගු කිරීමට අණපනත් පැනවීම.
- එහෙත් ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ නොහැකි වූ බව.
- තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය යළි ක්‍රියාත්මක කිරීම.
- 1833 කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි සිදුකළ ප්‍රතිසංස්කරණ යටතේ අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අවලංගු කිරීම, හා රජයෙන් නොමිලයේ ඉඩම් ලබා දුන් ක්‍රමය අහෝසි කොට ඒ වෙනුවට ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දීම.
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ අතර,
    - ව්‍යාවස්ථාදායක විධායක මණ්ඩල පිහිටුවීම මගින් ආණ්ඩුකාරයාගේ ඒකාධිපති බලතල අඩු කිරීම.
    - අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අවලංගු කිරීම
    - යුරෝපීයයන්ට මේ රටේ පදිංචි වීමට අවසර දීම
    - ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මගින් විදේශීය මූලධනය මෙරටට ගලා ඒමට මග පෑදීම, යනාදිය මගින් වතු වගාව දිරිමත් කිරීමට මග සෑදීම.

### 11.2.1 වතු වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය

- මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ පෘතුගීසීන් මෙන් ම ලන්දේසීන් ද මෙරට වනාන්තරවල ඉබේ වැවෙන කුරුඳු ලබා ගෙන වෙළෙඳාමේ යෙදීම.
    - ඔවුන් වෙළෙඳ භෝග වගා කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම.
    - ලන්දේසීන්ගේ පාලන කාලයේ අවසාන භාගයේ කුරුඳු වගා කිරීමට පෙළඹීම.
      (වර්තමාන කොළඹ කුරුඳුවත්ත එවැනි ප්‍රදේශයක් බව )
    - ක්‍රි.ව. 1833 කෝල්බෲක් කොමිසමේ යෝජනාවලින් නව ආර්ථික රටාවට පදනම වැටීම.

- රජයේ අනුග්‍රහය යටතේ කෝපි වගා කිරීමට අත්හදා බැලීම් සිදු කොට තිබීම
- කෝල්බෲක් යෝජනා අනුව සිවිල් සේවකයන්ට පෞද්ගලික ව්‍යාපාරවල යෙදීමට අවසර දීම
- සුළු වශයෙන් ආරම්භ වූ කෝපි වගාව 1840 පමණ වන විට උඩරට ප්‍රදේශයේ විශාල වතු වශයෙන් පැතිරී යාම.
- ඊට බලපෑ හේතු
    - එංගලන්තයට අපනයනය කළ කෝපිවලට අයකළ තීරු බද්ද අඩු කිරීම.
    - බටහිර ඉන්දීය දූපත්වල කෝපි වගාව පරිහානියට පත්වීම.
    - කෝපිවලට මූලධනය ආයෝජනය කළ ව්‍යාවසායකයින්ට විශාල ලාභ ලැබීම.
    - ඒ නිසා 'කෝපි පිස්සුව' ලෙස හැඳින්වෙන තරමට වතු වගාව ව්‍යාප්ත වීම.
    - සාර්ථක වැවිලි ක්‍රම අනුගමනය කිරීම.
    - අඩු වැටුපට දකුණු ඉන්දියානු දෙමළ ශ්‍රමිකයන් ගෙන්වීම.

    කෝපි වගාවට අවශ්‍ය ඉඩම්වලට ඉල්ලුම වැඩිවීම නිසා රජය සතු ඉඩම් වැඩි වැඩියෙන් විකිණීම සඳහා 1840 අංක 12 දරණ මුඩුබිම් පනත පැනවීම.
- එමඟින් උඩරට ජනතාවට හිමිවීමට තිබූ ඉඩම් පවා වතු වගාව සඳහා විදේශිකයින්ට විකිණීම.
- මෙම සීඝ්‍ර ව්‍යාප්තියේ අඩපණවීමක් 1847 දී සිදු වූ බව.
- 1853 තරමක් දුරට කෝපි වගාව යලි දියුණු වුව ද 1867 කෝපිවලට දිලීර රෝගයක් ( හෙමිලියා වෙස්ට්‍රාට්‍රික්ස් ) වැළඳීම නිසා වගාව පරිහානියට පත්වීම.
- කෝපි වගාවෙන් පසු කොකෝවා හා සිංකෝනා වගා කළ ද ඉන් ලැබුණු ආදායම අඩු වීම.
- ක්‍රි.ව. 1890 වනවිට තේ වගාව ව්‍යාප්ත වීමට බල පෑ හේතු
    - ලන්ඩන් වෙළෙඳ පොළේ තේ මිල ඉහළ යාම.
    - පොහොර භාවිතය වැඩි වීම.
    - දුම්රිය හා වෙනත් ප්‍රවාහන මාධ්‍යය දියුණු වීම.
    - කොළඹ වරාය දියුණු වීම.
    - දකුණු ඉන්දීය කුලීකරුවන් ගෙන්වීම නිසා ශ්‍රමය පහසුවෙන් ලබා ගත හැකි වීම.
- 1920 වන විට අලුතින් තේ ඉඩම් වගා කිරීම නිසා ආදායම වැඩි වුව ද 1929 ලෝක ආර්ථික පරිහානිය සමග තේ අපනයන ප්‍රමාණය අඩුවීමෙන් තේ ආදායම අඩු වීම.
- 1910 වන විට පොල් වගාවට මුදල් ආයෝජනය කිරීමට යුරෝපීයයන් අකමැති වූවත් ස්වදේශිකයන් ඊට අනුග්‍රහය දැක්වීම.

- පොල් නිෂ්පාදයෙන් අඩක් පමණ දේශීය පරිභෝජනයට යොදා ගැනීම.
- 19 සියවස අග භාගයේ ද රබර් වගාව හඳුන්වා දීම
- රබර් වගාවේ ව්‍යාප්තියට බලපෑ හේතු
    - පළමු ලෝක යුද්ධ සමයේ රබර් මිල ඉහළ යාම.
    - ඇමරිකා එක්සත් ජනපදය මෙරටින් වැඩිපුර රබර් මිලට ගැනීම.
    - බ්‍රිතාන්‍ය මෝටර් රථ කර්මාන්තය දියුණු වීම.
- 1929 ලෝක ආර්ථික පරිහානිය නිසා රබර් මිල පහත වැටුණි.
- මෙසේ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුගයේ ආර්ථික ක්‍රමය වතු වගාව පදනම් කර ගත් ආනයන අපනයන ආර්ථික රටාවක් බවට පත් විය.

### 11.2.3 පාරම්පරික කෘෂිකර්මය

- බ්‍රිතාන්‍ය ආණ්ඩුව මූලික වශයෙන් වතු වගාව කෙරෙහි යොමු වී සිටි හෙයින් දේශීය කෘෂි කර්මය කෙරෙහි උනන්දුවක් නොදැක්වීම.
- කොල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ දේශීය කෘෂිකාර්මික කටයුතු පවත්වා ගැනීමට මුල් වූ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කිරීම හේතු කොට ගෙන ගොවිතැන් කටයුතු අඩාලවීම.
- ගොවිතැන් කටයුතුවලට රජයේ අනුග්‍රහය නොලැබීම.
- වතු වගාවට ඉඩම් එළි පෙහෙලි කිරීම නිසා පහළ මට්ටමේ වූ බිම්වල කුඹුරු ගොවිතැන් කටයුතු විනාශයට පත් විම.
- ඉංග්‍රීසීන් පාරම්පරික කෘෂි කර්මය නොසලකා හැරීම නිසා ගොවි ජනතාව පීඩාවට පත් වූ අතර 1848 ඉංග්‍රීසි විරෝධී සටනට එක් හේතුවක් විම.
- අනතුරුව 19 වන සියවසේ දෙවන භාගය වනවිට ඇතැම් බ්‍රිතාන්‍ය පාලකයන් පාරම්පරික කෘෂි කර්මය දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබීම.
- ඔවුන් වැඩි අවධානයක් යොමු කළේ පැරණි වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කොට වියළි කළාපයේ ජනතාව පදිංචි කර වීමට ය.
- 1900 වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීමත් 1912 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීමත් නිසා දේශීය කෘෂිකර්මය තරමක් යහපත් අතට පත්විම.
- හෙන්රි වෝඩ්, හර්කියුලීස්, රොබින්සන්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝර්ඩන්, වෙස්ට් රිජ්වේ වැනි ආණ්ඩුකාරවරුන්ගෙන් වාරි කටයුතුවලට සේවයක් සිදුවීම.
- සමුපකාර ණය දෙන සමිති පිහිටුවීම හා ඉන් ගොවි ජනතාවට සේවයක් සිදුවීම.

### 11.2.4 නවීකරණය හා බටහිරකරණය

#### මධ්‍යම පන්තියේ වර්ධනය

- කෝල්බෘක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක කළ ඉංග්‍රීසි අධ්‍යාපනය හේතු කොට ගෙන යුරෝපීය සංස්කෘතිය ගරු කරන, දේශීය සංස්කෘතිය හෙළා දුටු ප්‍රභූ කණ්ඩායමක් බිහි විම.
- දේශීය ප්‍රභූ පන්තියට අයත් වූ අය බදු රේන්ද මිල දී ගැනීමෙන් ද, වතු වගාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමෙන් ද, ඇතැම් අය වතු හිමියන් බවට පත්වීමෙන් ද තම ධනය වර්ධනය කර ගැනීම.
- ඔවුහු තම ධනය, වතු මිල දී ගැනීම, වෙළෙඳ බෝග වගා කිරීම සහ තම දරුවන්ට උසස් අධ්‍යාපනය ලබා දීම වැනි කටුයතුවල යෙදවීම.
- 20 සියවසේ මුල් භාගයේ දී ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණවල පෙරමුණ ගත් මොවුහු දේශීය මධ්‍යම පන්තියට අයත් වූහ. එය යුරෝපීය පාලන ක්‍රමය හේතු කොට  බිහි වූ නව බලවේගයක් විය
- ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා බටහිර පන්නයට හැඩ ගැසුණු නාගරික පිරිසක් බිහි වූ අතර ධනය හා උගත්කම තිබුණ ද ඔවුන් ට දේශපාලන බලයක් නොතිබුණි.

#### කම්කරු ව්‍යාපාරය

- දේශීය ක්‍රමය යටතේ රජයේ පොදු කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය සපයා ගත්තේ නොමිලයේ සැපයුණ අනිවාර්ය රාජකාරී සේවය මගිනි.
- බ්‍රිතාන්‍ය යටතේ මෙරට වතු වගාව ආරම්භ වීමත් සමග මෙරට ශ්‍රමය මුදලට විකිණීමේ ක්‍රමයක් ආරම්භ විය. එමඟින් කම්කරු පන්තිය බිහිවීමේ ආරම්භය ඇතිවීම.
- වතුවලට අවශ්‍ය ශ්‍රමය මෙරටින් ලබා ගත නොහැකි වීම හේතු කොට ගෙන දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන්වා ගැනීන.
- මුල දී මධ්‍යම කඳුකරයේ වතුවල ශ්‍රමිකයින් වශයෙන් ද, 19 වන සියවස අවසානය වනවිට කොළඹ නගරයේ විවිධ නුපුහුණු කම්කරු සේවාවන් සඳහා ද දකුණු ඉන්දියාවෙන් පැමිණි කම්කරුවන් ලාංකික ජන සමාජය තුළ වෙන ම ජන කොට්ටාශයක් ලෙස වර්ධනය වීම.
- 19 වන සියවස තුළ දී නගර බිහිවීමත් සමඟ ඒවායේ මතු වූ බඩු බෑම, පැටවීම, රෙදි සේදීම, කරත්ත දැක්කීම, නැව් ප්‍රතිසංස්කරණය වැනි විවිධ රැකියා සඳහා සිංහලයන් ද පිවිසියහ.
- එපරිද්දෙන් නාගරික කම්කරුවන් හා වතු කම්කරුවන් වශයෙන් එකිනෙකට වෙනස් කොටස් දෙකක් ලෙස කම්කරු පන්තිය වර්ධනය විය.

වෘත්තීය සංගම් පිහිටුවා ගැනීම

- කම්කරුවන්ගේ සේවා තත්ත්වය දියුණු කර ගැනීම හා වැටුප් වැඩි කර ගැනීම සඳහා උද්ඝෝෂණ කිරීම පිණිස වෘත්තීය සංගම් වශයෙන් සංවිධානය වූයේ 1920 දශකයේ ය. එහි නායකත්වය දැරුවේ ඒ. ඊ. ගුණසිංහ මහතා ය.
- වතු කම්කරුවන් වෘත්තීය සංගම් වශයෙන් සංවිධානය වීම ආරම්භ වූයේ 1935න් පසුව ය. ඔවුන්ට නායකත්වය දුන්නේ නඩේසන් අය්යර් මහතා විසිනි.
- ලංකා සමසමාජ පක්ෂය පිහිටුවා ගැනීමෙන් පසුව එම පක්ෂය නාගරික මෙන් ම වතු කම්කරුවන් යන කොටස් දෙක ම අතර වෘත්තීය සංගම් පිහිටුවා කම්කරුවන් සංවිධානය කරීමට මුල් වී ක්‍රියා කිරීම.

ජාතික ව්‍යාපාරය

- මෙරට ජාතික ව්‍යාපාරය ආරම්භවන්නේ 19 වන සියවස අවසාන භාගයේ ය.
- ස්වභාෂා උගත් මධ්‍යම පන්තිකයන් හා ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තිකයන් ද ජාතික ව්‍යාපාරයට සහභාගී වීම.
- උගත් මධ්‍යම පන්තිකයන්ගෙන් එක් කොටසක් දේශපාලන බලතල ඉල්ලා උද්ඝෝෂණ කළ අතර තව කොටසක් ආගමික හා සංස්කෘතික නවෝදයක් ඇති කිරීම සඳහා සංවිධානය වීම.
- එහි ප්‍රධාන ලක්ෂණය වූයේ ස්වභාෂා උගත් මධ්‍යම පන්තිකයින් විසින් සංස්කෘතික නවෝදයක් ඇති කිරීම සඳහා ගෙන ගිය ව්‍යාපාරය යි.
- 20 වැනි සියවස ආරම්භ වනවිට ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තිය ජාතික ව්‍යාපාරයට එක් වීම.
- ඔවුන්ට අවශ්‍ය වූයේ අධිරාජ්‍යවාදී පාලකයන් විසින් ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රමය තුළ ඔවුන්ට ද බලතල ලබා ගත හැකි වන පරිදි ප්‍රතිසංස්කරණ ලබා ගැනීමට ය.
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනගෙන බටහිර පන්නයට හැඩ ගැසුන මධ්‍යම පන්තියට දේශීය සභ්‍යත්වය යළි පණ ගැන්වීමට අවශ්‍ය නොවීම.
- ඔවුන්ගේ ප්‍රශ්නය වූයේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුළින් රට පාලනය කිරීමේ අවස්ථා ඔවුන්ගේ පන්තියේ අයට ලබා ගැනීම සඳහා වීම.
- 1912 අමද්‍යප ව්‍යාපාරය, 1915 සිංහල, මුස්ලිම් අරගලය, 1919 ලංකා ජාතික සංගමය පිහිටුවා ගැනීම යනාදිය ජාතික ව්‍යාපාරයේ වැදගත් අවස්ථා කීපයක් වීම.

- 1915 සිංහල මුස්ලිම් අරගලයේ දී ජාතික ව්‍යාපාරයට සම්බන්ධ නායකයන් සිරභාරයට ගනු ලැබී ය.
    - ඩී.එස්. සේනානායක
    - එෆ්.ආර්. සේනානායක
    - ඩී.බී. ජයතිලක
    - සී. බටුවන්තුඩාව
    - සී.ඒ. හේවාවිතාරණ
    - ඒ.ඊ. ගුණසිංහ වැනි නායකයින් සිර භාරයට ගත් අතර විලියම් හෙන්රි පේද්‍රික් ඇතුළු කීප දෙනෙක් වෙඩි තබා මරා දැමීම.
- මෙම අසාධාරණකම්වලට විරුද්ධව කටයුතු කිරීමට 1919 ලංකා ජාතික සංගමය පිහිටුවා ගැනීම.
- එහි ප්‍රථම සභාපති වූයේ පොන්නම්බලම් අරුනාචලම් මහතා වීම.
- මෙම ජාතික ව්‍යාපාරය මෙහෙයවීම යටතේ 1920, 1924, 1931, යන වර්ෂවල දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගත හැකි වීම
- මෙම ජාතික ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ දී අමද්‍යප ව්‍යාපාරයේ නායකයින්ගේ සහයෝගය ද ලැබීම.
- ජාතික ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාවස්ථාදායක මණ්ඩලය තුළ ආසන බෙදා ගැනීම මුල් කොට ගෙන සිංහල හා දෙමළ නායකයින් අතර මතභේද ඇති විම.
- 1947 සෝල්බරි නිර්දේශ අනුව ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව 1948 දී ලංකාවට නිදහස ලැබීම

## 11.2.5 අධ්‍යාපනය

- ශ්‍රී ලංකාවේ මුල් යුගයේ දී පන්සල මුල් කර ගත් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක විම.
- පෘතුගීසීන් හා ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ කාලයේ දී පැරිෂ් පාසල මුල් කර ගත් අධ්‍යාපන ආයතන පැවතීම.
- 1812 රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ලංකාවට පැමිණීමත් සමඟ මිෂනාරි සමාගම් මෙරට අධ්‍යාපනය කෙරෙහි යොමු වීම.
    - ලන්ඩන්, බැප්ටිස්ට්, වෙස්ලියන්, චර්ච්, ඇමරිකන් යන මිෂනාරි සමාගම් කළ සේවය.
    - කෝල්බෲක් කොමසාරිස්වරයා ලංකාවේ අධ්‍යාපන සංවර්ධනයට කළ යෝජනා.
    - අධ්‍යාපන පරිපාලනයට පාසල් කොමිසම පත් කිරීම.
    - ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ඇති කිරීම.
    - ඉංග්‍රීසි උගත් ලාංකිකයන් රජයේ රැකියාවලට බඳවා ගැනීම.

- මැකන්සි ආණ්ඩුකාරවරයාගේ කාලයේ කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
  - මධ්‍යම පාසල් කොමිසම පත් කිරීම.
  - ස්වභාෂා හා ද්විභාෂා පාසල් ඇති කිරීම.
  - ආධාර ලබන පාසල් ඇති කිරීම.
  - මධ්‍ය පාසල් ක්‍රමය ඇරඹීම.
  - ප්‍රධාන නගරවල බාලිකා පාසල් පිහිටුවීම.
  - කොළඹ ඇකඩමිය (Royal College ) නමින් උසස් රැකියා සඳහා ශිෂ්‍යයන් පුහුණු කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- 1865 මෝර්ගන් ආණ්ඩුකාරයාගේ යෝජනා
  - පොදු ඉගැන්වීමේ දෙපාර්තමේන්තු පිහිටුවීම.
  - අධ්‍යාපනයේ වගකීම රජයට භාරදීම.
- 1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිහිටුවා පාලන කටුයතු භාර ගැනීම.
- 1921 විශ්ව විද්‍යාල කොලිජිය පිහිටුවීම.
- 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අධ්‍යාපන කටයුතු භාර විධායක කාරක සභාවේ සභාපති වූ සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා යටතේ මෙරට නිදහස් අධ්‍යාපනයට මඟ පෑදීම.
  - ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබාදීම.
  - අනිවාර්ය අධ්‍යාපනය.
  - බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිලේ අධ්‍යාපනය දීම.
  - ග්‍රාමීය අධ්‍යාපනය ප්‍රායෝගිකත්වයට නැඹුරු කිරීම සඳහා හන්දෙස්ස ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
  - පාසල් දිවා ආහාරය ලබා දීම.
  - දේශීය විභාග ක්‍රමයක් ඇති කිරීම.
  - දෙවන බස ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම.
  - පාසල තුළ ආගම අනිවාර්ය විෂයක් බවට පත් කිරීම.
  - ගුරු පුහුණුව සඳහා විශේෂ ආයතන පිහිටුවීම.
- මෙම යෝජනා අනුව ඒ ඒ පාසල් කාලය අවසන්වත් ම, උසස් හෝ වෘත්තීය අධ්‍යාපනයක් හෝ ලබා පාසලින් පිට වූ ශිෂ්‍යයන්ට රටේ අවශ්‍යතා අනුව රැකියා අවස්ථා සැපයීම මෙහි අරමුණු වීම.

## 11.6 ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය

- බ්‍රිතාන්‍ය පාලනය යටතේ ක්‍රිස්තියානි මිෂනාරි සමාගම් මගින් මෙරට අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම.
- ක්‍රිස්තියානි පූජකවරුන් දේශීය භාෂා ඉගෙන ගෙන මිෂනාරී පාසල්වල අධ්‍යාපන කටයුතු කරනු ලැබීම.

- සිංහල, දෙමළ හා මුස්ලිම් ජන කොටස් 1860 පමණ වන විට තම ආගම් හා සංස්කෘතින් නගා සිටුවීමට විවිධ ව්‍යාපාර ඇරඹීම.
- බෞද්ධ ප්‍රබෝධයට උරදුන් භික්ෂූන් වහන්සේලා
  - වලානේ සිද්ධාර්ථ හිමි - 1839 රත්මලානේ පරම ධම්ම චෛතිය පිරිවෙන ආරම්භ කිරීම.
  - හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - 1873 මාලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීම.
  - රත්මලානේ ධර්මාලෝක හිමි - 1875 පෑලියාගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීම.
  - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි - පංචමහා වාද මෙහෙයවීම.
- මෙම පංච මහා වාද නම්
  - 1864 - බද්දේගම වාදය
  - 1865 - වරාගොඩ වාදය
  - 1866 - උදම්විට වාදය
  - 1871 - ගම්පොල වාදය
  - 1873 - පානදුරා වාදය
- පානදුරා වාදය පිළිබඳව පුවත් පත් මගින් තොරතුරු දැන ගත් හෙන්රි ස්ටීල් ඕල්කෝට් තුමා ලංකාවට පැමිණීම.
- ඕල්කට්තුමාගේ ආගමික කටයුතු
  - එතුමා බෞද්ධයෙක් වීම.
  - පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම
  - එම සමාගම මගින් "සරසවි සඳරැස" නම් පුවත් පත අරඹා බෞද්ධයන් එකමුතු කිරීම.
  - ඉරුදින දහම් පාසල් ඇරඹීම.
  - වෙසක් පෝය දින රජයේ නිවාඩු දිනයක් කිරීම.
  - බෞද්ධ පාසල් ඇති කිරීම - කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ, , ගාල්ල මහින්ද වැනි විද්‍යාල
  - කාන්තා අධ්‍යාපනයට කොළඹ විශාඛා විද්‍යාලය හා මියුසියස් බාලිකා විද්‍යාලය ඇරඹීම.

- අනගාරික ධර්මපාල තුමා ඇති කළ මහා බෝධි සමාගමේ සේවය අගය කිරීම සර් ඩී.බී. ජයතිලක මැතිතුමාගේ නායකත්වයෙන් ඇති කළ තරුණ බෞද්ධ සංගමයෙන් සිදු වූ සේවය අගය කිරීම

හින්දු පුනර්ජීවනය

- හින්දු සංස්කෘතිය හා ආගම් නගා සිටුවීමට අරුමුගනාවලර් තුමා හා ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් දෙදෙනාගේ දායකත්වය.
- යාපනයේ වන්නාර් පෙන්නෙයි නගරයේ ප්‍රථම හින්දු පාසල ස්ථාපනය කිරීම.
- ශෛව පරිපාලන සභා ආයතන පිහිටුවා පොන්නම්බලම් රාමනාදන් මහතා හින්දු අධ්‍යාපනය නගා සිටුවීම.

ඉස්ලාම් පුනර්ජීවනය

- ඉස්ලාම් ආගමේ පුනරුදය සඳහා සිද්දි ලෙබ්බේ මහතා මූලික වී කටයුතු කිරීම.
- සහිරා විද්‍යාලය ආරම්භ කිරීම.
- අරාබි භාෂාව ඉගැන්වීම ව්‍යාප්ත කිරීම.
- මද්රාස නම් මුස්ලිම් ආගමික පාසල් ඇති කිරීම.
- මුස්ලිම් නේෂන් පුවත් පත ඇරඹීම.

- ආගමික පුනරුදයත් සමග ම සංස්කෘතික පුනරුදයක් ද සිදු වීම.
- සිංහල, පාලි, සංස්කෘතික පොත්පත් මුද්‍රණය කිරීම හා සිංහල පුවත් පත් මුද්‍රණය කිරීම, නවකතා ලිවීම ආදියෙන් සිංහල ජාතීන් අතර ජාතික අභිමානයක් ඇති වීම.
    - 1862- ලක්මිණි කිරණ, ලක්මිණි පහන, අරුණෝදය
    - 1866- ඥානාර්ථ ප්‍රදීපය
    - 1880- සරසවි සඳරැස
    - 1902 - සිංහල ජාතිය
    - 1909 - දිනමිණ පුවත්පත, වැනි පුවත්පත් බිහි කිරීම.
    - ආගමික හා ඓතිහාසික සිදධි අනුසාරයෙන් නාට්‍ය හා ප්‍රදර්ශන පැවැත්වීම.
    - පියදාස සිරිසේන මහතා ජාතිකාභිමානය ඇති කිරීමට නවකතා ලිවීම.
    - හින්දූන් විසින් හින්දු සාදනම්, වීරකේසරී, තිනකරන් වැනි පුවත් පත් ඇරඹීම.
- මෙවැනි උත්සාහයන් මගින් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව දේශීය ජනතාව කටයුතු කිරීම.

# 11.3 විසිවන සියවසේ ආසියාතික රටවල නැගීම

කාලච්ඡේද 12

## හැඳින්වීම

වර්තමාන ලෝකයේ බලවත් ආසියාතික රාජ්‍ය තුනක් වන ඉන්දියාව, ජපානය හා මහජන චීනය ලෝක බලවතුන් වශයෙන් වර්ධනය වීමට පාදක වූ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීම මේ ඒකකයේ අපේක්ෂාව වෙයි. ශ්‍රී ලංකාව මේ බලවත් රාජ්‍ය සමඟ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික යන ක්ෂේත්‍රවල සමීප සම්බන්ධතා පවත්වන බැවින් ශ්‍රී ලංකා පුරවැසියන් වශයෙන් මෙම රටවල් අත්කර ගත් ජයග්‍රහණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ.

ඉන්දියාව භාෂා සියයකට අධික සංඛ්‍යාවක් කථා කරන සංස්කෘතික අතින් විවිධත්වයක් ඇති ප්‍රාන්ත ගණනාවකට බෙදී ගිය රටක් වන බැවින් ඒකීය රාජ්‍යයක් ලෙස එක්සත් කිරීම ඉතා අසීරු කාර්යයකි. අශෝක, ධර්මාශෝක, මහා පද්ම නන්ද, චන්ද්‍රගුප්ත මෞර්ය, සමුද්‍රගුප්ත, හර්ෂ වර්ධන, අලාඋද්දීන්, බල්පි, අක්බාර් වැනි රජවරු ඉන්දියාව ඒකීය රාජ්‍යයක් ලෙස පවත්වා ගෙන යාමට උත්සාහ කළ ද මුළු ඉන්දියාව ම එක්සේසත් කිරීමට ඒ රජවරුන් අතරින් කිසිවකුට හැකි වූයේ නැත. ඉන්දියාවේ සමස්ත ඒකීය පාලනයක් ගෙන යාමට හැකි වූයේ බ්‍රිතාන්‍යයන්ට පමණි. එහෙත් එම ප්‍රයත්නය ද එතරම් සාර්ථක නොවී ය. දේශපාලන නිදහස ලබා ගත් වහා ම ඉන්දියාව සන්ධීය රාජ්‍යයක් බවට පත්විය.

අතීතයේ සිට ම ජපානය පැවතියේ රාජාණ්ඩුවක් වශයෙනි. තොකුගාවා - ෂෝගුන් පෙළපත පාලන කාලයේ දී වරෙක ලෝකයට විවෘත වූ ප්‍රතිපත්තියක් අනුගමනය කළ ද බටහිර සංස්කෘතික ලක්ෂණ ප්‍රචලිත වන්නට වූ තැන් සිට ලෝකයට ආවෘත වූ ප්‍රතිපත්තයක් වෙත මාරු විය. විවෘත හා ආවෘත ප්‍රතිපත්ති අනුගමනය කළ ද තොකුගාවා ෂෝගුන් යුගයේ ජපානය ආර්ථික අංශයෙන් වර්ධනයක් සිදු විය. එසේ වුව ද ජපානය ගෙන තිබූ ජයග්‍රහණ වේගයෙන් ඉදිරියට යන ලෝකය හා සසඳන විට ප්‍රමාණවත් නොවී ය. එබැවින් "මෙයිජි" ප්‍රතිසංස්කරණ සමයේ ද ජපානය නැවතත් බාහිර ලෝකයට විවෘත විය. මෙයිජි ප්‍රතිසංස්කරණ සමයේ දී ජපාන ආර්ථිකය විශ්මයජනක අන්දමින් වර්ධනය වූ අතර දෙවන ලෝක සංග්‍රාම සමයට එළඹෙන විට ජපානය බටහිර බලවතුන් හා සම තත්ත්වයේ පසු විය. ලෝක සංග්‍රාමය ජපානයට මහත් විනාශයක් අත් කර දුන්න ද සංග්‍රාමයෙන් පසු අලු ගසා දමා නැගී සිටි ජපානය නූතන ලෝකයේ මහා බලවතකු බවට පත් විය. ජපානය අද ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වන රාජ්‍යයකි. එහෙත් පූර්ණ රාජාණ්ඩුව නිරූපණය කරන අධිරාජ්‍ය පදවිය නාමික වශයෙන් අදත් පවතී.

වසර 4000 කට වැඩි ඉතිහාසයක් ඇති චීනයේ ඓතිහාසික විකාශය අනෙක් රටවලට වඩා වෙනස් ය. ක්‍රි.පූ. 2000 පමණ සිට චීනය පාලනය කළේ රජ පෙළපත් විසිනි. බලවත් රජවරුන්ගේ පාලන කාලවල දී චීනය හා චීනයෙන් බැහැර ප්‍රදේශවල චීන අධිරාජ්‍ය පැතිර ගිය අතර අධිරාජ්‍යයා වටා බලය කේන්ද්‍ර ගත විය. දුර්වල රජවරුන්ගේ පාලන කාලවල දී ප්‍රාදේශීය පාලකයෝ ස්වාධීන වූහ. මන් චු පෙළපත චීනයේ අවසාන රජ පෙළපත වන අතර ඉන් පසුව

බටහිර ජාතින්ගේ බලපෑම චීනයට එල්ල විය. එසේ වුව ද චීනය කිසි විටෙක බටහිර ජාතීන්ගේ යටත් විජිතයක් බවට පත් වූයේ නැත. මාඕ-ට්සේ-තුං යටතේ සංවිධානය වූ කොමියුනිස්ට් පක්ෂය 1949 දී මහජන චීන සමූහාණ්ඩුව පිහිටු වීය.

ඉන්දියාව, ජපානය හා චීනය යන රටවල් ඓතිහාසික විකාශයේ දී ලබා ගෙන ඇති ප්‍රතිඵල එකිනෙකට වෙනස් වුව ද මේ රටවල් අද ආසියාවේ ආර්ථික අතින් දැවැන්ත ජයග්‍රහණ ලබා ගත් රාජ්‍ය වශයෙන් හැඳින්විය හැකි ය.

නිපුණතාව : විසිවන සියවසේ ආසියාතික රටවල් නැගි සිටි ආකාරය ආදර්ශයට ගෙන කටයුතු කරයි.

නිපුණතා මට්ටම :
- රටේ ස්වාධිපත්‍ය රැක ගැනීම සඳහා ඉන්දියානුවන් ආදර්ශවත් ව ක්‍රියාකළ ආකාරය ආදර්ශයට ගෙන කටයුතු කරයි.
- ජපානය ලෝකයේ ප්‍රබල රටක් ලෙස ගොඩනැගුණ ආකාරය අධ්‍යයනය කර ඉන් ලබාගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි.
- සැලැස්මකට අනුව කටයුතු කරමින් චීනය නැගී සිටි ආකාරය අධ්‍යයනය කර ඉන් ලබාගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි.

විෂය අන්තර්ගතය

## 11.3 විසිවන සියවසේ ආසියාතික රටවල නැගීම

### 11.3.1 ඉන්දියාව

- ජාතික ව්‍යාපාරයේ ආරම්භය, 1857 කැරැල්ල
- මේ කැරැල්ල පූර්වයෙන් ඇති වූ කැරලි 1806, 1844, 1850, 1852
- 1857 සිපොයි කැරැල්ලට බල පෑ හේතු - සංග්‍රාමික දේශපාලන, ආගමික හා සමාජීය හේතු
- කැරැල්ලේ නායකයෝ නානා සහිබ්, කාන්තියා කෝපි, ලක්ෂ්මි බායි
- කැරැල්ල අසාර්ථක වීමට හේතු
- කැරැල්ලේ ප්‍රතිඵල : වෙළෙඳ සමාගම යටතේ පැවති සියලු ම ඉන්දියානු ප්‍රදේශ කිරීටය යටතට පත්වීම. (1858 පනත )
- ජාතික අනුරාගය : බාල් ගංගාධාර තිලක්, ජාලියන්පාල, බාස් බේදවාචකය
- අන්තවාදීන් හා මධ්‍යස්ථවාදීන් අතර එකඟතාව

මහත්මා ගාන්ධි

- දකුණු අප්‍රිකාවේ රජයට එරෙහිව ගත් ක්‍රියාමාර්ග
- මධ්‍යස්ථ මතවාදීන් ලැබූ ජයග්‍රහණ ( සත්‍යග්‍රහ ව්‍යාපාර මගින් )
  කම්කරු සේවයේ යෙදවීම් සඳහා ඉන්දියානුවන් බඳවා ගත් පොරොන්දු පත්‍ර ක්‍රමය අහෝසි කිරීම
  චම්පා ප්‍රදේශයේ ඉන්ඩිගෝ වවන්නන්ගේ දුක් ගැනිවිලි විසඳීම
- 1920 - 22 අතර කාලයේ දී කළ සත්‍යග්‍රහ ව්‍යාපාරය
- උසාවි, ව්‍යවස්ථාදායක මණ්ඩල, අධ්‍යාපනික ආයතන බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කිරීම
- බ්‍රිතාන්‍ය ලබා දුන් නම්බුනාම හා තනතුරු අත්හරින ලෙස ප්‍රභූන් පෙළඹවීම
- මහත්මා ගාන්ධිගේ අනෙකුත් බ්‍රිතාන්‍ය විරෝධී සත්‍යග්‍රහ ව්‍යාපාර, සයිමන් කොමිසම වර්ජනය කිරීම, ගාන්ධිගේ දණ්ඩ පා ගමන

ඉන්දියාවේ බෙදීයාම

- පකිස්ථාන් ව්‍යාපාරයේ ආරම්භය
- මොහොමඩ් අලි ජින්නා හා ඔහුගේ කාර්යභාරය
- ක්‍රිප්ස් දූත මෙහෙය
- ගාන්ධිගේ ඉන්දියාවෙන් ඉවත් වෙනු ව්‍යාපාරය
- සුභාස් චන්ද්‍රබෝස් හා ඉන්දියා ජාතික යුද හමුදාව
- ඉන්දියාව නිදහස ලැබීම සහ පකිස්ථානය බිහිවීම

( වැඩි විස්තර සඳහා පහත දැක්වෙන ග්‍රන්ථ පරිශීලනය කරන්න )

1. ඉන්දියා ඉතිහාසය II කාණ්ඩය සිංහ හා බැනර්ජි
   පිටු 601 - 690 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2. ලෝක ඉතිහාසය බී.වී. රාඕ ( පරිවර්තනය මහාචාර්ය මාලිනී ඇඳගම )
   පිටු 294 - 306 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 11.3.2 ජපානය

- ටොකුගාවා යුගය
  - වසර 700ක් පමණ ජපානය පාලනය කළ ටොකුගාවා ෂෝගුන් පෙළපත 17 සියවස මුල සිට ආවෘත ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
  - 17 සියවසේ සිට 19 සියවස දක්වා ම යුරෝපීයයන් වෙළෙඳාම සඳහා ජපානයේ ආවෘත ප්‍රතිපත්තිය වෙනස් කිරීම සඳහා අරඹන ලද සියලු ප්‍රයත්න අසාර්ථක වීම.

- ඈත පෙරදිග වෙළෙදාමේ වැඩි හිමිකමක් තිබූ ඇමරිකා එක්සත් ජනපදයට ජපානයේ වරාය පහසුකම් අවශ්‍ය වීම . ( ඇමරිකානු දුම් නැව් සඳහා යෝග්‍ය පහසුකම් ජපන් වාරයවල තිබුණු බැවින් මෙය අත්‍යවශ්‍ය කාර්යයක් විය.
- කොමඩෝර් පියරිගේ ( Pierry ) දුම්නැව් හමුදාව හා තුවක්කු සවිකළ බෝට්ටු ඊඩෝ ( පසුව ටෝකියෝ ) වරායට පැමිණ තම අවශ්‍යතා පාලකයන්ට දැනුම් දීම.

- ඇමරිකානු ඉල්ලීම
  1. අබලන් වූ ඇමරිකානු යාත්‍රා ආරක්ෂා කිරීම හා නාවිකයින් රැක ගැනීම.
  2. වෙළෙඳ නැව්වලට ඉන්ධන සැපයීම
  3. නැව් අලුත්වැඩියා කිරීම.
  4. වෙළෙදාමට අවසර දීම.

- ඉල්ලීම්වලට ඉඩ ලැබෙන බවට ජපාන පාලකයින්ගෙන් ඉඟියක් ලැබුණ ද ඇමරිකානු කොන්සල් ජනරාල් හැරිස් ටවුන්සෙන්ඩ් පැමිණෙන තෙක් අනුමැතිය නොලැබීම.
- හැරිස් ටවුන්සෙන්ඩ් පෙන්වා දුන් කරුණු
  1. චීනය යුරෝපීයන්ට වෙළෙදාම සඳහා අනුමැතිය නොදීමෙන් බ්‍රිතාන්‍ය ඇතුළු රටවල් කිහිපයක් චීනය ආක්‍රමණය කිරීම.
  2. චීනය තුළ සාමකාමී පසුබිමක් නොමැති වීම.
  3. ඉල්ලීම්වලට ඉඩ ලැබුණහොත් සාමකාමීව වෙළෙඳ කටයුතු කළ හැකි වීම.
- හැරිස් ටවුන්සෙන්ඩ් හා ජපානය සමඟ ඇති කර ගත් එකඟතාව අනුව වරාය කිහිපයක වෙළෙඳ පහසුකම් ලැබීම.
- මේ සිද්ධියෙන් පසු අනෙකුත් රටවල් ද වෙළෙඳාම සඳහා අවස්ථාව ඉල්ලා සිටීම.
- වසර 700ක් පාලනය ගෙන ගිය ෂෝගුන්

- මෙයිජි ප්‍රතිසංස්කරණය

- ජපාන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වීම.
- ෂෝගුන් පෙළපතේ බලය බිඳ දැමීම.
- අධිරාජ්‍යයා වූ මුත්සිහිතෝ සියලු බලතල තම අතට ගෙන ජපානය නවීකරණය කිරීමේ කාර්යය මෙහෙයවීම.
- සුළු වෙනස්කම් කිහිපයක් සහිතව බටහිර දේශපාලන ක්‍රමය හඳුන්වා දීම

- ආර්ථික ප්‍රතිපත්තිය
    1. වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම
    2. කාර්මීකරණයට ප්‍රමුඛස්ථානයක් දීම
    3. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
- ජපානයේ ආරක්ෂක හමුදා ප්‍රතිසංස්කරණය කිරීම
- ජපන් අධිරාජ්‍යවාදය හා ඊට බලපෑ හේතු
- පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ජපානය ලෝක බලවතකුගේ තත්ත්වයට පත්වීම.
- දෙවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ වන කාලය වන විට ජපානය සෑම ක්ෂේත්‍රයකින් ම දියුණුවට පත්වීම.
- දෙවන ලෝක යුද්ධයේ දී අක්ෂ පක්ෂයේ රටක් බවට පත්වීම. ඉතාලිය, ජපානය, ජර්මනිය
- යුද්ධ සමයේ දී ජපානය පර්ල් වරායට පහර දීම.
- ඇමරිකා එක්සත් ජනපදය පරමාණු බෝම්බ දැමීම, හිරෝෂිමා, නාගසාකි
- විනාශ වූ ජපානය, මාර්ෂල් සැලැස්ම යටතේ නැවත නැගී සිටීම.

11.3.3 චීනය

- චීන විප්ලවයේ ප්‍රධාන අවස්ථා
    - මන්චු (Manchu) රාජවංශය බලයෙන් පහවීමෙන් පසු දේශපාලන අවුල් වියවුල්වලින් ගහණ කාල පරිච්ඡේදයක් උදාවීම.
    - යුද නායකයින් බලවත් වීම.
    - ආචාර්ය සුන් - යුත් සෙන්ගේ කුවෝමින්තාන් සංවිධානය
    - මේ සංවිධානයට සෝවියට් ආධාර ලැබීම.
    - කුවෝමින්තාන්වරු කැන්ටනයේ බලය තහවුරු කර ගැනීම.
    - කැන්ටන් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
        * සුන්-යුත්-සෙන් දර්ශනය
        * සුන්-යුත්-සෙන් අභාවය හා ඔහු කෙරේ තිබූ භක්තිය වැඩිවීම.
        * කොමියුනිස්ට්වරුන්ගේ තාවකාලික පරාජය
        * කුවෝමින්තාන්වරු බෙයිජිං අල්ලා ගැනීම
        * චියැං කායිෂෙක් ගේ දේශභිමානී හමුදා නැන්කිං ප්‍රදේශයේ බලය අල්ලා ගැනීම.
        * දේශාභිමානී ජාතිකවාදීන්ගෙන් ඉටු වූ කාර්ය භාරය
        * ජාතිකවාදීන්ගේ පරාජය : කුවෝමින්තාන්වරු අසාර්ථක වීම
        * විප්ලවය සඳහා මඕසේතුංගේ උපක්‍රම
        * දීර්ඝ පා ගමන
        * ජපන් යුද්ධය

- දෙවන ලෝක මහා සංග්‍රාමය සමයේ චීනය
  - සිවිල් යුද්ධයට පසුබිම සැකසීම
  - මහජන චීනය බිහිවීම
  - 1945 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
  - කොමියුනිස්ට් විප්ලවයේ උත්තරීතර ලක්ෂණ : ප්‍රජාතන්ත්‍රවාදී අඥාදායකත්වය
  - ආර්ථික සැලැස්ම, අරමුණු හා අපේක්ෂා
  - කෘෂි කාර්මික විප්ලවය හා ඉදිරි මහා පිම්ම

- සංස්කෘතික විප්ලවය
  - සංස්කෘතික විප්ලවයේ ප්‍රතිඵල
  - සමාජයීය වෙනස්වීම

- විදේශ සම්බන්ධතා
    * ඇමරිකා එක්සත් ජනපදය
    * සෝවියට් රුසියා සමූහාණ්ඩුව
  - ජාතික චීනයේ (තායිවාන් ) බිහිවීම
  - මාඕ සේතුං යුගය

# 11.4 ලෝක මහා සංග්‍රාම හා ලෝක සාමය සඳහා ප්‍රයත්න

## හැඳින්වීම

විවිධාකාර සිදුවීම් රාශියක් මුල් කර ගෙන 20 වන සියවසේ දී යුරෝපයේ ප්‍රධාන යුද්ධ දෙකක් ඇති විය. ලොව පුරා නොයෙක් රටවල් මෙයට සහභාගී වූ බැවින් මේ යුද්ධ ලෝක සංග්‍රාම වශයෙන් හඳුන්වනු ලැබේ. 1914 සිට 1919 දක්වා පළමුවෙනි ලෝක සංග්‍රාමයත් 1939 සිට 1945 දක්වා දෙවන ලෝක සංග්‍රාමයත් පැවතුනි. එයින් සිදු වූ දේපල විනාශය හා මනුෂ්‍ය ඝාතනය අති විශාල ය.

එබැවින් මෙවැනි විනාශකාරී තත්වයක් නැවත ඇතිවීම වැළැක්වීම පිණිස හා ලෝක සාමය ආරක්ෂා කිරීම පිණිස 1919 දී ජාතීන්ගේ සංගමය පිහිටුවන ලදී. එයින් අපේක්ෂිත අරමුණු ඉටු නොවූ බැවින් 1939 දී නැවත දෙවන ලෝක සංග්‍රාමය ඇති වූයෙන් නැවතත් ලෝක සාමය ආරක්ෂ කිරීම සඳහාත්, ජාතීන්ගේ දියුණුව සැළසීම සඳහාත් ප්‍රධාන ජාතීන් එක් වී එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගනු ලැබූහ.

පළමුවන ලෝක සංග්‍රාමය හා දෙවන ලෝක සංග්‍රාමය පිළිබඳවත් එයින් අනතුරු ව පිහිටුවන ලද ජාතීන්ගේ සංගමය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳවත් තොරතුරු විග්‍රහකර බැලීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා

- යුද්ධයේ බිහිසුණු බව හා සාමයේ අර්ථවත්බව තුලනාත්මක ව විමර්ශනය කරයි

නිපුණතා මට්ටම

- පළමුවන හා දෙවන ලෝක මහා සංග්‍රාම මානව සංහතියේ ඉදිරි ගමනට බාධාකාරී වූ ආකාරය විමර්ශනය කරමින් සංග්‍රාම තත්වයන් ගෙන් වැලකී සිටීමට කටයුතු කරයි.
- ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශක්තිමත් විග්‍රහ කරයි.
- පැසිසිට් වාදයේ හා නාසි වාදයේ ලක්ෂණ විමසා බලයි.

විෂය අන්තර්ගතය

## 11.4 ලෝක මහා සංග්‍රාමය සහ ලෝක සාමය සඳහා ප්‍රයන්ත

- 1914 - 1919 දක්වා යුරෝපය පුරා පැවති යුද්ධ මාලාව පළමු ලෝක සංග්‍රාමය වශයෙන් හැඳින්වේ.

### 11.4.1 පළමුවන ලෝක මහා සංග්‍රාමයයට හේතු

- යටත් විජිත සඳහා වූ තරගය සියලු ම රටවල් කාර්මීකරණය වීම නිසා යුරෝපා ජාතීන් අතර අමුද්‍රව්‍ය ලබා ගැනීම හා වෙළෙඳාම සඳහා ඇති වූ තරගය

  ( ආසියා - අප්‍රිකා රටවල )
  - ඇල්සේස් ලොරේන් ප්‍රශ්නය
  - යුරෝපය පිල් දෙකකට බෙදීම
  - ජර්මන් කයිසර්වරුන් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය
  - එංගලන්ත - ජර්මන් නාවික තරගය
  - 1914 සාරාජිවෝ සිද්ධිය
  - ජර්මන් නාවික ප්‍රතිපත්තියට විරුද්ධව ඇමරිකා එක්සත් ජනපදය මිත්‍ර සංවිධානයට එකතුවීම

- ප්‍රධාන පාර්ශව කරුවන්
  - එංගලන්තය, ප්‍රංශය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය
  - ජර්මනිය, ඔස්ට්‍රියාව, ඉතාලිය, තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව
- ප්‍රතිඵල
  - විශාල වශයෙන් මනුෂ්‍ය ඝාතන සහ දේපල විනාශවීම
  - වරදකරුවා වශයෙන් සලකා ජර්මනියට වර්සෙල්ස් ගිවිසුමෙන් දැඩි දඬුවම් පැමිණවීම.
  - ඇල්සේස් - ලොරේන් ප්‍රංශයට පවරා දීම
  - යුරෝපයේ පැවති ඒකාධිපති රාජාණ්ඩු බිඳ වැටීම
  - නව රාජ්‍ය ගණනාවක් බිහිවීම

    උදා : චෙකොස්ලෝවැකියාව<br>යුගෝස්ලෝවියාව
  - පැරණි රාජ්‍ය නාම වෙනුවට නම් යෙදීම

    උදා : මෙසපොතේමියාව - ඉරාකය<br>කොන්ස්තන්තිනෝපල් - ඉස්තාන්බුල්
  - ලෝක සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා ජාතීන්ගේ සංගමය පිහිටුවා ගැනීම

### 11.4.1 ජාතීන්ගේ සංගමය හා ලෝක සාමය

- පළමුවන ලෝක යුද්ධයෙන් පසු ඇමරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන්ගේ සංකල්පයක් මත ජාතීන්ගේ සංගමය ආරම්භ විය

- අරමුණු

  - ජාතීන් අතර ඇති වූ ආරවුල් සාකච්ඡා මගින් විසඳා ගැනීම.
  - ආර්ථික සම්බාධක පැනවීම මගින් ආක්‍රමණ වැළැක්වීමට කටයුතු යෙදීම.
  - මානව වර්ගයාගේ සාමකාමී පැවැත්ම සඳහා අවශ්‍ය වෙනත් පියවර ගැනීම
  - ජාත්‍යන්තර අවබෝධය සහ සහයෝගය ගොඩ නැංවීම.
  - කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කර දීම.
  - විශ්ව සාමූහිකත්වය මගින් ලෝක සාමය ආරක්ෂා කිරීම.

- සාමය සඳහා ගත් ප්‍රයත්න

  - සයිලීෂියාව සම්බන්ධයෙන් ජර්මනිය හා පෝලන්තය අතර ගැටුම්, ග්‍රීසිය හා බල්ගේරියාව අතර ඇති වූ ගැටුම්, ඉරානය හා තුර්කිය අතර ඇති වූ අර්බුද යනාදිය සමතයකට පත් කිරීම.
  - ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වයට ලක්ව තිබූ යටත් විජිතවල පරිපාලන කටයුතු සාර්ථක ලෙස අධීක්ෂණය කිරීම.
  - ඔස්ට්‍රියාව, හංගේරියාව හා ග්‍රීසිය යන රටවලට ආර්ථික ආධාර ලබා දීම.
  - සරණාගතයන් පුණරුත්තාපනය කිරීම.
  - ලෙඩ රෝග මර්ධනය කිරීම.
  - නීති විරෝධී වහල් වෙළෙඳාම සහ මත් ද්‍රව්‍ය වෙළෙඳාම මර්ධනය කිරීම.

- අසාර්ථක වීමට හේතු

  - ජාතීන්ගේ සංවිධානය යෝජනා කළ එමෙන් ම එවකට ලෝකයේ බලවත් වූ ඇමරිකා එක්සත් ජනපදය එයට සහභාගී නොවීම.
  - පළමුවන ලෝක යුද්ධයේ වරදකරුවා බවට පත් වූ ජර්මනියට ජාතීන්ගේ සංගමයේ අසුනක් නොලැබීම.
  - නිත්‍ය හමුදාවක් නොතිබීම.
  - මහා බලවතුන් අතර එකමුතුවක් නොතිබීම.
  - ආරම්භ කරන ලද විශ්ව සාමූහිකත්වය ක්‍රියාත්මක කිරීම අසීරු ප්‍රයත්නයක් වීම.

11.4.3 පැසිස්ට් වාදය හා නට්සිවාදයේ නැගීම

ලෝක සංග්‍රාම දෙක අතර කාලයේ යුරෝපයේ රටවල් කිහිපයක ව්‍යාප්ත වූ දේශපාලන සංකල්පයක් ලෙස පැසිස්ට්වාදය හා නට්සිවාදය දැක්විය හැකි ය. මෙය ආඥාදායක පාලන ක්‍රමයකි. ප්‍රජාතන්ත්‍රවාදය, ලිබරල්වාදය හා කොමියුනිස්ට්වාදය යන සංකල්ප වලට විරුද්ධව පැන නැගුන මත වාදයක් ලෙස හැඳින්විය හැකි ය.

- මුසෝලිනි යටතේ ඉතාලිය

  - පළමු ලෝක යුද්ධය අවසානයේ ඉතාලියේ බලාපොරොත්තු ඉටු නොවීම
  - ඉතාලිය දේශපාලන, ආර්ථික සමාජික යන සෑම අංශයකින් ම ඉතා දුර්වල තත්වයකට පත්වීම.
  - 1921 දී බෙනිටෝ මුසොලිනි විසින් පැසිස්ට් වාදය පිහිටුවීම.
  - පැසිස්ට් පක්ෂය ජනප්‍රිය වීම.
  - තුන්වැනි වික්ටර් එම්මැනුවෙල් මුසොලිනිට අගමැති පදවියට ආරාධනා කිරීම.
  - මුසොලිනි ඉතාලියේ ඒකාධිපති පාලනයක් ඇති කිරීම.
  - පාප්තුමා සමඟ 1929 දී ලැටුරන් ගිවිසුම ඇති කර ගැනීම.
  - ඉතාලිය ආර්ථික අතින් නංවාලීම.
  - යුද සේවය අනිවාර්ය කිරීම.

- නාසිවාදය

  - අඥාදායක පාලනයක් වීම.
  - ජර්මන් ජාතිකයන් ලොව ශ්‍රේෂ්ටතම ජාතිය බව පැවසීම.
  - පිරිසිදු ආර්යයන්ගෙන් පැවත එන්නන් ලෙස සැලකීම.
  - අඩෝල්ෆ් හිට්ලර්ගේ නායකත්වයෙන් ජර්මනියේ නාසිවාදය ව්‍යාප්ත වීම.
  - පළමු ලෝක යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් විසිර ගිය ජර්මානුවන් නැවත ඒකරාශි කිරීම ඔහුගේ පරමාර්ථය වීම.




11.4.1 සිතියම - විසිරි ගිය ජර්මානුවන්

- හිට්ලර් යටතේ ජර්මනිය
  - වයිමාර් සමූහාණ්ඩුව
    - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු දුර්වලතා
    - දේශපාලන වශයෙන් ස්ථිර ආණ්ඩු පිහිටුවා ගත නොහැකි වීම
    - දේශපාලන අස්ථාවර භාවය
  - ආර්ථික දුෂ්කරතා
    - පළමු ලෝක යුද්ධයෙන් පසුව
    - යටත් විජිත අහිමිවීම
    - වන්දි මුදල් ගෙවීමට සිදුවීම

  - ඒකාධිපතයකුගේ බිහිවීමට සුදුසු පරිසරයක් සකස්වීම.
  - හිට්ලර් බලයට පත්වීම.
- ජර්මනිය යළි ගොඩනැගීම
  - ජර්මනියේ ආර්ථිකය නගා සිටුවීම.
  - ප්‍රවාහන කටයුතු දියුණු කිරීම.
  - අනිවාර්ය යුද සේවය ආරම්භ කර යුද හමුදාව ශක්තිමත් කිරීම.
  - චරපුරුෂ සේවයක් ඇති කර ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් මර්දනය කිරීම
- ප්‍රදේශ ඈඳා ගැනීම
  - රයින්ලන්තය ඈඳා ගැනීම
  - චෙකොස්ලෝවැකියාව ඈඳා ගැනීම
  - පෝලන්තය ආක්‍රමණය කිරීම
- දෙවන ලෝක යුද්ධය ආරම්භ කිරීම

11.4.4 දෙවන මහා ලෝක සංග්‍රාමය


- හේතු
    - හිට්ලර් යටතේ ජර්මනිය බලවත් වීම.
    - හිට්ලර්ගේ ක්‍රියා කලාපය.
        * ජාතීන්ගේ සංගමයෙන් ඉවත් කිරීම.
        * රයින්ලන්ත ප්‍රදේශ ඈඳා ගැනීම.
        * චෙකොස්ලෝවැකියාව ආක්‍රමණය.
    - ආසන්න ම හේතුව පෝලන්තය ආක්‍රමණය කිරීම.
    - ඉතාලියේ මුසොලිනිගේ ක්‍රියා කලාපය.
        * ඇබිසීනියාව ආක්‍රමණය කිරීම.
    - ජපානය පෙරදිග බලවතෙකු ලෙස නැගී සිටීමට උත්සාහ කිරීම.
        * චීනය සතු මැන්චූරියාව ජපානය විසින් ආක්‍රමණය කිරීම.
    - ජාතීන්ගේ සංගමයේ දුර්වලතා.

- පාර්ශවකරුවන්
    - මිත්‍ර පක්ෂය - එංගලන්තය, ප්‍රංශය, රුසියාව ඇමරිකා එක්සත් ජනපදය
    - අක්ෂ පක්ෂය - ජර්මනිය, ඉතාලිය, ජපානය, හංගේරියාව, බල්ගේරියාව හා රුමේනියාව පසුව මිත්‍ර බලවතුන්ට එක්වීම.
- ප්‍රතිඵල
    - ලෝකයේ මෙතෙක් ඇති වූ බිහිශුසුම සංග්‍රාමය වීම.
    - හිරෝෂිමා නාගසාකි පරමාණුබෝම්බවලින් විනාශ වීම නිසා එහි බිහිසුණු ප්‍රතිඵල අනාගත පරම්පරාව තුළ ද දැකිය හැකි වීම.
    - ජර්මනිය, නැගෙනහිර හා බටහිර ජර්මනිය යනුවෙන් දෙකඩ වීම.
    - මෙතෙක් ලෝක බලවතුන් වශයෙන් සිටි එංගලන්තයට හා ප්‍රංශයට එම ස්ථානය අහිමි වීම.
    - ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව සුපිරි බලවතුන් ලෙස නැගී සිටීම.
    - ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා ලෙස ඉදිරිපත් වීම.
    - එය අනුගමනය කරමින් බ්‍රිතාන්‍ය, ප්‍රංශය, බෙල්ජියම, ඕලන්දය, බටහිර ජර්මනිය ආදී ධනවාදී අර්ථක්‍රම සහිත රටවල ප්‍රජාතන්ත්‍රවාදී කඳවුරක් ලෙස සංවිධානය වීම.
    - සෝවියට් රුසියාව මුල් කොට ගෙන කොමියුනිස්ට් බල කඳවුරක් යුරෝපයේ බිහිවීම.
    - පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, බල්ගේරියාව, යුගෝස්ලෝවියාව, නැගෙනහිර ජර්මනිය ආදී රටවල් එම කඳවුරට අයත් වීම.

- ලෝක සාමය ආරක්ෂ කිරීම සහ ජාතීන්ගේ ජීවන තත්ත්වය දියුණු කරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම.
- යුද්ධයෙන් විනාශයට පත් වූ පරාජිත රටවල් විශේෂයෙන් බටහර ජර්මනිය හා ජපානය නගා සිටුවීමට ඇමරිකා එක්සත් ජනපදය විසින් මාෂල් සැලැස්ම හඳුන්වා දීම.
- බ්‍රිතාන්‍ය හා ප්‍රංශය සතුව පැවති යටත් විජිතවලට නිදහස ලැබීම.

### 11.4.5 එක්සත් ජාතීන්ගේ සංවිධානය

- දෙවන ලෝක සංග්‍රාමය අවසන් වීමෙන් පසු ලෝක සාමය සහ ආරක්ෂාව උදෙසා පිහිටුවනු ලැබූ ජගත් සංවිධානයයි.




11.4.1 රූපය  එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවිධාන ව්‍යුහය

- ආරම්භය
    - බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල්, ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්, සෝවියට් රුසියාවේ නායක ජෝෂප් ස්ටාලින් යන තිදෙනා 1943 දී ටෙහෙරාන් නගරයට රැස් ව ලෝක සාමය සඳහා සංවිධානයක් ඇති කර ගැනීමේ වැදගත්කම සාකච්ඡා කිරීම.
    - 1945 සැන් ෆ්‍රැන්සිස්කෝ සමුළුවේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය නිල වශයෙන් අනුමත කිරීම.
    - ඇමරිකා එක්සත් ජනපදය, සෝවියට් රුසියාව මහා බ්‍රිතාන්‍යය සහ චීනය ඇතුළු රටවල් 51ක් සහභාගී වීම.

- අරමුණු
    - ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම.
    - ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම.
    - ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා මානුෂීය ස්වභාවයෙන් යුක්ත ප්‍රශ්න විසඳීම.
    - මානව අයිතිවාසිකම් හා මූලික නිදහස තහවුරු කිරීමෙහි ලා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම.
    - මෙම පොදු අරමුණු සපුරා ගැනීම සඳහා ජාතීන්ගේ මූලාස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

- ව්‍යුහය
    - එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රධාන ආයතන 6කින් සමන්විත වීම.
    - මහා මණ්ඩලය, ආරක්ෂක මණ්ඩලය, ආර්ථික හා සමාජයීය කටයුතු පිළිබඳ මණ්ඩලය භාරකාර මණ්ඩලය, ජාත්‍යන්තර අධිකරණය මහලේකම් කාර්යාලය
- සාමය සඳහා ගත් ප්‍රයත්න
    - සුවස් අර්බුදය විසඳීම.
    - ඉරාකය විසින් කුවේට් දේශය ආක්‍රමණය කිරීම වැළැක්වීම.
    - කෝංගෝ ප්‍රදේශයේ ඇති වූ ආරවුල් විසඳීම.
    - දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී ප්‍රතිපත්ති දෝෂ දර්ශනයට ලක්වීම.
    - 1960 - 1970 අතර කාලය තුළ දී අධිරාජ්‍ය වාදයට විරුද්ධව අප්‍රිකානු රටවල් ගෙන ගිය නිදහස් ව්‍යාපාරවලට එක්සත් ජාතීන්ගේ සහාය ලැබීම.
    - 1966 රෝඩේෂියාවට විරුද්ධව ආර්ථික සම්බාධක පැනවීම.
    - දෙවන ලෝක සංග්‍රාමයෙන් දුර්වල තත්ත්වයට පත් වූ රටවල් ආර්ථික හා සමාජික වර්ධනයට එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අනුබද්ධ ආයතන මගින් විශාල සේවයක් කිරීම.

      උදා : UNESCO, ILO, WHO

# 11.5 ලෝක බලතුලනය - දෙවන ලෝක යුද්ධයෙන් පසු

කාලච්ඡේද 12

## හැඳින්වීම

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු යුරෝපයේ එතෙක් බලවත් ව තිබූ ප්‍රංශය එංගලන්තය ජර්මනිය වැනි රටවල් පසුපසට තල්ලු වී ගොස් ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසයාව අතර එම රටවල් දෙක මුල් කොට ගෙන ලෝකය දෙපිලකට බෙදෙන්නට විය. ඇමරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවක් හා ධනවාදී ආර්ථික ක්‍රමයක් අනුගමනය කළ අතර ප්‍රංශය එංගලන්තය, බටහිර ජර්මනිය වැනි රටවල් ඇමරිකා එක්සත් ජනපදයේ නායකත්වය දැරූ පිලට අයත් වූහ. සමාජවාදී දේශපාලන හා ආර්ථික රටාවක් අනුගමනය කළ සෝවියට් දේශයේ නායකත්වය දැරූ පිලට පෝලන්තය, නැගෙනහිර ජර්මනිය, චෙකොස්ලොවැකියාව, යුගෝස්ලෝවියාව, කියුබාව වැනි රටවල් එක් විය.

20 වන සියවසේ දෙවන භාගයේ මුල සිට අවසානය දක්වා ප්‍රධාන කඳවුරු අතර දෘෂ්ඨිමය ගැටුම හා බලය සඳහා වූ අරගල සීතල යුද්ධය බවට පත්විය. එනම් අවි ගැටුම් සීමාවී දශක තුනක් පමණ කාලයක් තස්සේ පැවත මෙම අරගලය සෝවියට් දේශයේ බිඳ වැටීමත් සමඟ අවසන් විය. ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය ලෝක බලවතකු ලෙස නැගී ආකාරයත්, ඔවුන් දෙදෙනා අතර ඇති වූ ගැටීම් හා අවසානයේ සෝවියට් දේශය බිඳ වැටුණු ආකාරයත් පිළිබඳ තොරතුරු විග්‍රහ කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

මෙම බල කඳවුරුවල නැගීම, වර්ධනය හා බිඳ වැටීම ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි ද බලපෑම් කර ඇති බැවින් එම බල කඳවුරු පිළිබඳ අධ්‍යයනය ශ්‍රීලංකාවේ ඉතිහාසය හැඩ ගැසුන ආකාරය විමසා බැලීම සඳහා පහසු වනු ඇත.

නිපුණතා : ලෝක ඉතිහාසය ගොඩ නැගීමට පාදක වූ දේශපාලන බලවේග පිළිබඳ තුලනාත්මකව විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම :

- ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය ලෝක බලවතෙකු ලෙස නැගී සිටි අයුරු තුලනාත්මකව විග්‍රහ කරයි.
- සමාජවාදී කඳවුර විසිවන සියවසේ බිඳවැටීමට හේතු වූ කරුණු විමර්ශනය කරයි.
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරීත්වය අවි ගැටුම් සීමාවීමට හේතු වූ ආකාරය විග්‍රහ කරයි.

විෂය අන්තර්ගතය

## 11.5 ලෝක බල තුලනය - දෙවන ලෝක යුද්ධයෙන් පසු

### 11.5.1 ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතුන් ලෙස නැගී සිටීම

- නැගී සිටි ආකාරය
  - සියවස් තුනක පමණ වූ ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේ ඉතිහාසය තුළ එරට විදේශීය කටයුතුවලට සහභාගී වන්නේ 20 වන සියවස ආරම්භයත් සමග වීම.
  - 20 වන සියවස ආරම්භ වන විට ලෝකයේ කටයුතු සිදු වූයේ යුරෝපයේ රටවල් මුල් කර ගෙන වීම (යුරෝ කේන්ද්‍රීය ).
  - පළමු ලෝක සංග්‍රාමයේ දී බ්‍රිතාන්‍ය ප්‍රංශය වැනි යුරෝපයේ ප්‍රබල රටවල් අයත් වූ මිත්‍ර පක්ෂයට ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධ වීම
  - පළමු ලෝක යුද්ධයෙන් මිත්‍ර පක්ෂය ජය ගැනීමත් සමඟ ඇමරිකා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර ප්‍රතිරූපය වඩාත් ඉස්මතු වීම
  - පළමු ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝකයේ සාමය සුරක්ෂිත කර ගැනීම සඳහා පිහිටුවා ගත් ජාතීන්ගේ සංගමය නැමැති ජාත්‍යන්තර සංවිධානය ගොඩ නැගීම සඳහා වූ යෝජනාව සහ සැලැස්ම ද ඉදිරිපත් කළේ ඇමරිකා එක්සත් ජනපදය වීම.
  - යුරෝපා කටයුතුවලට එක්සත් ජනපදය සම්බන්ධ වීම පිළිබඳ සෙනට් සභාවේ විරෝධය පළවීම නිසා ජාතීන්ගේ සංගමයට එකතු නොවීම.
  - ජාතීන්ගේ සංගමය අසාර්ථකවීමත් සමඟ දෙවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ විය. එහි දී ජර්මනිය, ඉතාලිය හා ජපානය අක්ෂ පක්ෂයේ ප්‍රබල නැගී සිටීම මැඩ පවත්වන්නට ඇමරිකා එක්සත් ජනපදයට හැකි වූයේ 1945 දී ජපානයේ හිරෝෂිමා, නාගසාකී නගරවලට එක්සත් ජනපදය විසින් පරමාණු බෝම්බ හෙලීමත් සමඟ වීම.
  - ඒ සමඟ ම ඇමරිකා එක්සත් ජනපදය ජාත්‍යන්තර වශයෙන් ඉතා ප්‍රබල තත්ත්වයකට පත් වීම.
  - එමෙන්ම 1945 ජූනි මස සැන් ප්‍රැන්සිස්කෝ නුවර ජාතීන් පහකින් සමන්විත සමුලුව මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය සකස් කිරීම. එහි දී ඇමරිකා එක්සත් ජනපදය ඉතා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කිරීම.
  - 1945 ඔක්තෝබර් 24 දින පටන්, එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය ක්‍රියාත්මක වන අතර එහි දී ප්‍රංශය, බ්‍රිතාන්‍ය , සෝවියට් දේශය, චීනය හා ඇමරිකා එක්සත් ජනපදය යන රටවලට නිත්‍ය නියෝජිත තනතුරු ලැබීම. එම රටවල් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ නිශේධ බලය හිමි පංච මහා බලවතුන් බවට පත්වීම. එහි දී සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී ව්‍යාපාරයේ කටයුතු සීමා කිරීමට ඇමරිකා එක්සත් ජනපදය පෙරමුණ ගැනීම.

- තාරකා යුද්ධ වැඩ සටහන් තුළින් සමාජවාදී කඳවුරට ප්‍රබල තර්ජනයක් එල්ල කිරීමට හැකි මට්ටමකට පත්වීම.
- අසූව දශකයේ රුසියාවේ සිදු වූ ග්ලාස්නොව් හා පෙරස්ත්‍රොයිකා ප්‍රතිසංස්කරණ වලින් පසුව සෝවියට් දේශය බිඳ වැටුණු පසු ඇමරිකා එක්සත් ජනපදය ලෝක කටුයතුවල ප්‍රබලයා බවට පත්වීම

- ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වයට පත්වීම

- පළමු ලෝක යුද්ධයෙන් පසුව ලෝක බලවතකුගේ තත්වයට පත්වෙමින් සිටි ඇමරිකා එක්සත් ජනපදය 1917 දී බිහි වූ සෝවියට් දේශය කෙරෙහි දැඩි විරුද්ධතාවයක් දැක්වීම.
- 1917 ඔක්තෝබර් විප්ලවයෙන් සමාජවාදී සෝවියට් දේශය බිහිවිය. එතැන් පටන් සමාජවාදී කඳවුරට පක්ෂ රටවල් බිහිකර ගැනීමට කටයුතු කිරීම සිදුවිය. එහි දී චීනය, කියුබාව, නැගෙනහිර යුරෝප රටවල් සමාජ වාදී කඳවුරට නැඹුරු වීම.
- සෝවියට් දේශය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සමාජවාදී කඳවුරේ රටවලට එල්ලවන අහිතකර යෝජනාවල දී නිශේධ බලය යොදා ගනිමින් සෝවියට් කඳවුර ශක්තිමත් කර ගැනීමට ඉදිරිපත් වීම.
- සමාජවාදී කඳවුරට එරෙහි ධනවාදී කඳවුරේ ප්‍රධානත්වය ගත්තේ ඇමරිකා එක්සත් ජනපදයයි. සමාජවාදී කඳවුර සමාජවාදී ආර්ථිකයත් කොමියුනිස්ට් පාලනයත් ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත් අතර ධනවාදී කඳවුර ධනවාදී ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ව්‍යාප්ත කිරීමට උත්සාහ ගැනීම.
- ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී පිලේ නායකයා වශයෙන් ධනවාදී පිල ශක්තිමත් කිරීම සඳහා 1949 ඇමරිකා එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO ) පිහිටුවා ගැනීම
- ' නේටෝ ' සංවිධානයට පෘතුගාලය, ඉතාලිය, බටහිර ජර්මනිය, ග්‍රීසිය, නෙදර්ලන්තය ඇතුළු රටවල් 16ක් අයත් වූ අතර ඔවුන්ට එරෙහිව උතුරු ඇමරිකාවේ හෝ යුරෝපයේ දී අවි ගැටුමක් ඇති වුවහොත් එය සියලු ම රටවලට එල්ල වූ ප්‍රහාරයක් ලෙස සැලකීමට ගිවිස ගෙන සිටීම
- ධනවාදී රටවලට සහාය වූයේ ඇමරිකා එක්සත් ජානපදයයි. උදාහරණ වශයෙන් 1948 උතුරු හා දකුණු කොරියාව යනුවෙන් කොරියාව කොටස් දෙකකට බෙදුන පසු ධනවාදී ක්‍රමයට නැඹුරු වූ දකුණු කොරියාව ඇමරකා එක්සත් ජනපදය විසින් භාර ගැනීම. 1948 දී බර්ලිනය බෙදීගිය අතර එහි දී ද ඇමරිකා එක්සත් ජනපදය ධනවාදයට පක්ෂව බටහිර බර්ලිනයේ පැත්ත ගැනීම.

- සමාජවාදී රාජ්‍යයන් බිඳ දැමීමට ද ඇමරිකා එක්සත් ජනපදය කටයුතු කර ඇත. උදා : කියුබානු විප්ලව අවස්ථාවේ පළා ගිය හා පිටුවහල් කළ කියුබානු ජාතිකයින්ගෙන් සමන්විත හමුදාවක් ඇමරිකා එක්සත් ජනපදය විසින් ගොඩ නගා පුහුණු කරවනු ලැබී ය. එම හමුදාව 1969 දී පිදෙල් කස්ත්‍රෝගේ හමුදාවට එරෙහි ව සටන් කළහ. කියුබාවට සෝවියට් ආධාර ලැබීම නිසා ඇමරිකා එක්සත් ජනපදය එහි දී අසාර්ථක විය.
- ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වූයේ ය යන චෝදනාව මත මියැන්මාර් (බුරුම) හමුදා රජය කෙරෙහි එක්සත් ජනපද රජයේ ප්‍රසාදයක් නොමැති අතර ධනවාදය අගයන පකිස්ථානු හමුදා රජයට අධාර ලබා දීම.
- මෙසේ ධනවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රචලිත කිරීමේ නායකත්වය ලෝක බලවතා ලෙස සැලකෙන එක්සත් ජනපදයට හිමි වීම.

## 11.5.2 සෝවියට් දේශය ලෝක බලවතකු ලෙස නැගී සිටීම

දෙවන ලෝක යුද්ධයෙන් පසු සෝවියට් දේශයේ නායකත්වය යටතේ කොමියුනිස්ට වාදී රටවල් අතර එකමුතුවක් ඇති වීම.

- හේතු
  - දක්ෂ පාලකයන් බිහිවීම
  - ජෝසප් ස්ටාලින් සහ නිකිටා කෘෂෙව් වැනි කාර්යශූර පාලකයන් බලයට පත් වීම
  - ජෝසප් ස්ටාලින්ගේ නායකත්වය යටතේ රාජ්‍ය පාලනය ලිහිල් නොකළ යුතු බව විශ්වාස කිරීම

- සමාජවාදය පදනම් කර ගත් ආර්ථිකයක් ගොඩ නැගීම

  - දෙවන ලෝක යුද්ධයට පෙර පැවති තත්ත්වයට නැවත සෝවියට් දේශය ගෙන ඒමට උත්සාහ කිරීම.
  - පස් අවුරුදු සැලසුම් යටතේ සැලසුම් සහගත ආර්ථිකයක් ඇති කිරීම.
  - සෝවියට් දේශයේ හතරවන පස් අවුරුදු සැලැස්ම 1946 දී ආරම්භ කිරීම.
  - 1953 ද බලයට පත් වූ කෘෂෙව් වඩාත් කාර්යක්ෂම ආර්ථිකයක් ගොඩ නැංවීම සඳහා ප්‍රාදේශිය ආර්ථික සංවිධාන පිහිටුවීම.

- සෝවියට් රුසියානු සමූහාණ්ඩු ජන ජීවිතය නගා සිටුවීමට කටයුතු කිරීම.
- විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීමට කටයුතු කිරීම.
- එහි ප්‍රතිඵලයක් වශයෙන් 1961 වන විට රුසියානු ජාතික යූරි ගගාරින් ප්‍රථමවරට අභ්‍යවකාශය තරණය කිරීම

- සමාජවාදී කඳවුරේ නායකත්වයට පත්වීම

  - සෝවියට් දේශයේ මඟ පෙන්වීම මත නැගෙනහිර ජර්මනිය, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව හංගේරියාව, පෝලන්තය, යුගෝස්ලෝවියාව වැනි නැගෙනහිර යුරෝපා රටවල් සමාජවාදී ආර්ථික රටාවක් අනුගමනය කිරීම.
  - කොමියුනිස්ට් ආධිපත්‍යයට විරුද්ධව ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ගන්නා ලද 'නේටෝ' සංවිධානයට ප්‍රතිචාර වශයෙන් කොමියුනිස්ට් රටවල් 1955 'වෝර්සෝ සම්මුතිය' ඇති කිරීම.
  - 1949 චීන විප්ලවයේ දී කොමියුනිස්ට්වාදය ජය ගැනීම නිසා සමාජවාදී පිල ශක්තිමත් වීම.
  - චීනය කොරියාව, හංගේරියාව, පෝලන්තය, බල්ගේරියාව සහ නැගෙනහිර යුරෝපා කොමියුනිස්ට් රටවල් අතර නායකත්වය සෝවියට් දේශයට හිමි වීම.
  - මෙම රටවල් අතර ආර්ථික වශයෙන් ද, යුදමය වශයෙන් ද එකමුතු බවක් දක්නට ලැබීම.

### 11.5.3 සීතල යුද්ධය

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරීත්වය නිසා අවි ගැටුම සඳහා අවස්ථාවක් නොමැතිවීම

  - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යාම හා ඊට ඇති තර්ජන වැළැක්වීම, ජාතීන්ගේ නිදහස ගරු කිරීම, සුහදතාවය වර්ධනය හා ලෝක සාමය තහවුරු කිරීම, ආර්ථික, සමාජයීය, සංස්කෘතික හෝ මානුෂීය වූ ජාත්‍යන්තර ගැටලු විසඳීම.

- දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය මුල් කර ගෙන ධනවාදී හා සමාජවාදී බල කඳවුරුවල බලය ව්‍යාප්තවීමේ දී ඇති වීමට ගිය ගැටුම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙන් නිරාකරණය වී ඇත.

  උදා : • 1962 දී සෝවියට් දේශය විසින් ඇමරිකා එක්සත් ජනපදය දෙසට එල්ල කර කියුබාවේ මිසයිල රඳවන ලදී. එයට ප්‍රතිචාර වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය සෝවියට් දේශය දෙසට එල්ල කර තුර්කියේ මිසයිල රඳවන ලදී. එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා ඇමරිකානු ජනාධිපති ජෝන් කෙනඩි හා රුසියානු නායක කෘෂේව් සමග සාකච්ඡා කර ප්‍රශ්නය විසඳීම.

  - මිසරයේ හිටපු ජනාධිපති අබ්දුල් ගමාල් නසාර් විසින් 1956 ද සුවස් ඇල ජනසතු කරන ලදී. මේ නිසා අපහසුතාවට පත් බ්‍රිතාන්‍ය හා ප්‍රංශය ද ඊශ්‍රායලය සමග එක්ව යුද්ධ ප්‍රකාශ කළේ ය. එහි දී මිසරය හා එම රටවල් අතර ඇතිවීමට ගිය අවි ගැටුම් එක්සත් ජාතීන්ගේ සාම හමුදාව යැවීම නිසා වැළැකිණි.

- තව ද එක්සත් ජාතීන්ගේ අවි පාලනය හා නිරායුධකරණ ගිවිසුම් නිසා එම අවි භාවිතයට තිබූ අවස්ථාව වළක්වන ලදී. ඒ තුළින් ද අවි ගැටුම් වැළැක්වුණි.

  උදා : • 1959 අත්සන් කළ ඇන්ටාක්ටික් සම්මුතිය මගින් න්‍යෂ්ටික කටයුතු සඳහා ඇන්ටාක්ටිකාව යොදා නොගැනීමට බලවතුන් එකග කර ගෙන ඇත.

  - 1963 අත්සන් කරන ලද අභ්‍යාවකාශයේ පොළොවේ මතුපිට හෝ ජලය යට හෝ වායු ගෝලයේ න්‍යාෂ්ටික අවි රඳවා තැබීම පිළිබඳ සම්මුතිය මගින් එම අවි භාවිතය තහනම් කරන ලදී.

- 1974 සෝල්ට් I හා සෝල්ට් II ගිවිසුම් මගින් ද අවි භාවිතය සීමා කරන ලදී. (stratagic Arms Limitation Talk - මූලෝපායික අවි සීමාකරන සාකච්ඡා )

## ලෝක ආර්ථික පාලනය

- සොවියට් දේශය සමාජවාදී ආර්ථික ප්‍රතිපත්තිය හා කොමියුනිස්ට් පාලනය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම. එහි දී සෝවියට් දේශය ව්‍යාවසායකත්වය මුල් කර ගෙන සංවෘත්ත ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක කළේය. රාජ්‍ය අංශය එක ම නිෂ්පාදකයා ලෙස කටයුතු කිරීම නිසා තරඟකාරී නිෂ්පාදනයක් හෝ මිළ තරගයක් ඇති නොවීම.

- 1950 දශකය වන විට ලෝකයේ බොහෝ ආණ්ඩු සමාජවාදී ආර්ථික ප්‍රතිපත්තිය අගයමින් රාජ්‍ය ව්‍යාවසායක් ඇති කිරීම. එහි දී මහා පරිමාන නිෂ්පාදන හා සේවා කර්මාන්ත ඇති කිරීම. ඒ සඳහා සෝවියට් දේශය අදාළ තාක්ෂණික සහාය එම රටවලට ලබා දීම. උදා : ශ්‍රී ලංකාවට ටයර්, තුනීලෑලි සංස්ථාව, ඔරුවල වානේ කම්හල වැනි ආයතන සෝවියට් දේශයෙන් ලබා දීම.
- සමාජවාදය ව්‍යාප්ත කිරීමේ දී සෝවියට් දේශයට අමතරව නැගෙනහිර ජර්මනිය, චීනය වැනි රටවල් ද එවැනි ආධාර තුන්වන ලෝකයේ රටවලට ලබා දිම. උදා : ලංකාවට චීනයෙන් වේයන්ගොඩ පෙහෙකම්හල හා නැගෙනහිර ජර්මනියෙන් තුල්හිරිය පෙහෙකම්හල ලබා දීම.
- 1950 දශකය වන විට ලොව බොහෝ රටවල් ධනවාදී පෞද්ගලික ව්‍යාවසායන් සඳහා වූ ඉඩ ප්‍රස්ථා අව ම කිරීම. බොහෝ පෞද්ගලික සමාගම් ජනසතු කිරීම. උදා : බ්‍රිතාන්‍ය ප්‍රංශ සමාගම් සතුව පැවති සුවස් ඇල 1956 දී මිසර ජනාධිපති නසාර් විසින් ජනසතු කිරීම. ලංකාව වැනි කුඩා රාජ්‍යයන් ද තෙල්, ගෑස්, වරාය, බස් ආදී ජනසතු ව්‍යාපාර ආරම්භ කිරීම.
- සමාජවාදී කඳවුරේ ඇති වූ පිරිහීමත් සමඟ කොමියුනිස්ට් පාලනය හා සමාජවාදී ආර්ථිකය 1980 දශකයේ සිට දෙදරා යාම.
- අනෙක් අතට ඇමරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදී පාලනය හා ධනවාදී ආර්ථිකය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම.
- එහි දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසයානු සංවර්ධන බැංකුව ආදී මූල්‍ය ආයතන හරහා දිගු කාලීන ණය දිළිදු රටවලට ලබා දී පෞද්ගලික අංශය දිරි ගැන්වීම සඳහා කොන්දේසි පැනවීම.
- තව ද ඇමරිකානු හා ධනවාදී කදවුරේ සමාගම් දිගු කාලීන ඒකාධිකාරයක් පවත්වා ගනිමින් දිළිදු රටවල තම කර්මාන්ත පවත්වාගෙන යාම. උදා : ශ්‍රී ලංකාවේ ප්‍රීමා පිටි කම්හල සඳහා දිගු කාලීන ඒකාධිකාරයක් පවත්වාගෙන යාම.
- පූර්ණ ධනවාදී හෝ සමාජවාදී ක්‍රමයකට යාමට අකමැති වූ මිශ්‍ර ආර්ථික ක්‍රමයන් අනුගමනය කිරීමට ඇතැම් රටවල් පෙළඹුණ ද 1980න් පසු ( රුසියාවේ බිඳ වැටීමෙන් පසු ) ඇමරිකා එක්සත් ජනපදය සහ ධනවාද ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ආයතනවල කොන්දේසිවලට නතුවීමට ඉන් බොහෝ රටවලට සිදු වීම.
- බටහිර රටවල මෙම ප්‍රතිපත්තිය නිසා දිළිදු රටවල් ආර්ථික වශයෙන් ගැටලුවලට මුහුණ පෑම. මේ නිසා අධාර මත යැපමට සිදුවීම. ආධාර දෙන රටවල් හා දිළිදු රටවල් අතර සාකච්ඡා නිරතුරුව පැවැත්වීම. උදා : G 7 රටවල්

## සෝවියට් දේශයේ බිඳ වැටීම

- 1980 දශකයේ අග භාගයේ දී සෝවියට් දේශයේ එවකට ජනාධිපති මිහායිල් ගොර්බචොව් මහතා විසින් හඳුන්වා දෙන ලද ගලාස් නොට්ස් සහ පෙරස්ත්‍රොයිකා නම් වූ ආර්ථික ප්‍රතිසංස්කරණ බොරිස් යෙල්ට්සිං මහතා විසින් තව දුරටත් ක්‍රියාත්මක කිරීම.

- එහි ප්‍රතිඵලයක් වශයෙන් රුසියාව තුළ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වී ආර්ථික නිදහස ලබා දීම.
- නිදහස් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම නිසා සමාජවාදී ආර්ථික ප්‍රතිපත්ති ඉවත්වීම.
- ඒ සමඟම සමාජවාදී සෝවියට් රුසියානු සමූහාණ්ඩුව ( සෝවියට් දේශය) බිඳ වැටීම. සෝවියට් සමූහාණ්ඩුවට ඇතුළත් ව පැවැති කසකස්ථානය, යුක්රේනය, උස්බෙකිස්තානය, බෙලෝරුසියාව, ලිතුවෙනියාව ආදී ප්‍රාන්ත රාජ්‍ය ස්වාධීන විම.
- රුසියාව සහ පසුව බෙලෝරුසියාව තවත් රාජ්‍යයන් කිහිපයක් එකතු වී රුසියානු පෙඩරේෂණය පිහිටුවා ගැනීම.
- ලෝකයේ පැවැති බල කඳවුරු දෙකේ බල තරඟය (සීතල යුද්ධය ) ද සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසුව අවසන් වීම.
- සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු වොර්සෝ සංවිධානය ද විසුරුවා හැරීම.

නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය


- දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බිහි වූ සමාජවාදී හා ධනවාදී යන බල කඳවුරු දෙකෙන් ඒකකටවත් ගැති නොවී සිටි ජාතීන් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි (Non Alignment ) ප්‍රතිපත්තිය ලෙස හැඳින්වීම.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු බටහිර අධිරාජ්‍යවාදයෙන් නිදහස ලැබූ තුන්වන ලෝකයේ රටවල් ලෙස සැලකෙන ආසියාවේ හා අප්‍රිකාවේ රටවල් නොබැඳි ව්‍යාපාරයේ සාමාජිකයන් වීම.
- සෝවියට් හා ඇමරිකානු කඳවුරු දෙකෙහි නායකයන් නව නිදහස් රාජ්‍ය හැකි තරම් තම පිළට වැඩි කර ගැනීමට උත්සාහ දරණ විට දිගු කලක් අධිරාජ්‍යවාදයට හසුව සිට නිදහස ලැබූ ජාතීන්ට අවශ්‍ය වූයේ තම නිදහස රැක ගෙන, කිසිදු සුපිරි බලවතකුට හිස නොනමන ස්වාධීන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ය. ඒ අනුව නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය බිහිවීම.
- නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ නිර්මාතෘ ලෙස ඉන්දියාවේ ප්‍රථම අගමැති ජවහාර් ලාල් නේරු, ඉන්දුනීසියානු ජනාධිපති සුකර්නෝ, යුගෝස්ලෝවියානු ජනාධිපති මාෂල් ටිටෝ, ඊජිප්තු ජනාධිපති අබ්දුල් ගමාල් නසාර් කටයුතු කිරීම.
- නොබැඳි ජාතීන්ගේ ප්‍රතිපත්ති යනු බල කඳවුරු දෙකෙන් ම ඉවත් වී හුදකලාව සිටීම නොව නිදහස, ආරක්ෂාව, සාමය හා සහයෝගීතාවය පදනම් කරගත් එකකි. එනම්
    - සුපිර බලවතුන්ට නොනැමී, නොබැඳි තම රටවල සුභසිද්ධියට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයක් ගොඩ නගා ගැනීම.
    - යුධ ගිවිසුම්වලට විරෝධය දැක්වීම හා කවර ආකාර හෝ අධිරාජ්‍යවාදයකට ප්‍රතිපක්ෂ වීම.

- නොබැඳි ව්‍යාපාරය ලෝකයේ බලවත් ම සාම ව්‍යාපාරවලින් එකක් වීම.

- 1955 ඉන්දුනීසියාවේ බැංඩුංහි දී පවත්වන ලද සම්මේලනය නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ ආරම්භක සැසිය වීම.
- එම සම්මේලනයට අනුව මෙම අප්‍රිකානු - ආසියානු ජාතීහු තම මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම.
- එම මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය පංචශීල ප්‍රතිපත්තිය නමින් හැඳින්වීම.

- 1956 යුගෝස්ලෝවියාවේ බෙල්ග්‍රේඩ් අගනුවර දී පැවැත් වූ රැස්වීමේ ද මෙම පංචශීල ප්‍රතිපත්තියට ප්‍රයෝගික පදනමක් ලබා දීම.

පංචශීල ප්‍රතිපත්තිය




- ආරම්භක සැසියේ දී ආසියානු ජාතීහු විසි තුනක් හා අප්‍රිකානු ජාතීහු හතක් සහභාගී වූ අතර දින දින වැඩි වූ එහි සාමාජිකත්වය වර්තමානයේ 108කින් සමන්විත වේ.
- නොබැඳි ජාතීන්ගේ සමුළුව වසර 3කට හෝ 4කට වරක් පැවැත්වීම.
- නොබැඳි ජාතීන්ගේ ප්‍රථම නායක සමුළුව 1961 බෙල්ග්‍රේඩ් හිදී පැවැත්වීම.
- 1976 කොළඹ දී පස්වන නොබැඳි ජාතීන්ගේ නායක සමුළුව පැවැත්වීම.
- එම සමුළුව ලෝකයේ දුප්පත් හා පොහොසත් ජාතීන් අතර පරතරය අඩු කරන නව ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් අවධාරණය කිරීම.
- වර්තමානයේ ලෝකයේ බල කඳවුරු දෙකක් නොමැති බැවින් මෙහි සාමාජික රටවල් අතර සහයෝගීතාව රැක ගැනීම අරමුණ වීම.

# 11.6 නිදහසින් පසු ශ්‍රී ලංකාව

කාලච්ඡේද 16

## හැඳින්වීම

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයෙහි සිදු වූ වෙනස්කම් රැසකි. මේවා ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි විවිධ ආකාරයෙන් බලපෑවේ ය.

1947 සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රී ලාංකිකයන් අත් කර ගත් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වර්තමානය දක්වා විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් විකාශය වූ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙම ඒකකය මගින් අපේක්ෂිත ය. මෙහි දී දේශපාලන පක්ෂ ක්‍රමය, කැබිනට් ආණ්ඩු ක්‍රමය පිළිබඳ මෙන් ම 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කිරමට අපේක්ෂිත ය.

එමෙන් ම නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා අනුගමනය කළ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් ද සිදු කෙරෙන අතර අධ්‍යාපනය, කෘෂිකර්මය, රාජ්‍ය ව්‍යාවසාය කර්මාන්ත හා සමාජ සුභ සාධනය සම්බන්ධයෙන් සිදු වී ඇති වෙනස්කම් හා ලබා ඇති ප්‍රගතිය පිළිබඳවත් විමසා බැලීමට මෙම ඒකකය අධ්‍යයනය මගින් තව දුරටත් අපේක්ෂා කෙරේ.

නිපුණතා : නිදහසින් පසු දේශපාලන හා සමාජ ආර්ථික ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වී ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය කරමින් ඉදිරි කටයුතු සැලසුම් කරයි.

නිපුණතා මට්ටම :

- පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ දී පක්ෂ ක්‍රමය හා කැබිනට් ක්‍රමයේ වැදගත්කම විමර්ශනය කරයි.
- 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධන විග්‍රහ කරයි.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධනය උපාය මාර්ගයන්හි ඇති ඵලදායීතාව විමර්ෂණය කරයි.

## 11.6 නිදහසින් පසු ශ්‍රී ලංකාව

### 11.6.1 පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය

- ඩොනමෝර් කොමසාරිස්වරුන් විසින් 1931 දී ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලද විධායක කාරක සභා ක්‍රමය සහිත රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙනුවට 1947 දී සොල්බරි කොමිසමේ නිර්දේශ මත බ්‍රිතාන්‍ය සම්ප්‍රදායේ පාර්ලිමේන්තු ක්‍රමයක් ශ්‍රී ලංකාවට ලැබීම.

- දේශපාලන පක්ෂ ක්‍රමය හා එහි ආරම්භය.
  - බ්‍රිතාන්‍ය සම්ප්‍රදායයේ පාර්ලිමේන්තු ක්‍රමයක් සාර්ථක වීම සඳහා පොදු ජාතික ප්‍රතිපත්ති සහිත දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවතිය යුතු වීම.
  - එවැනි පක්ෂ ක්‍රමයක් නොතිබීම නිසා ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ බ්‍රිතාන්‍ය සම්ප්‍රදායයේ පාර්ලිමේන්තු පාලන ක්‍රමයක් වෙනුවට විධායක කාරක සභා ක්‍රමයක් සහිත පාලන ක්‍රමයක් ශ්‍රී ලංකාවේ බිහිවීම.
- නිදහස ලබා ගැනීම සඳහා මූලික වූ ජාතික ව්‍යාපාර ගණනාවක් බිහි වුව ද ඒවා දේශපාලන පක්ෂ ලෙස සංවිධානය වී නොතිබීම.

  උදා : 1912 දී අමාද්‍යප ව්‍යාපාරය
  1914 දී ලංකා ප්‍රතිසංස්කරණ සංගමය
  1919 දී ලංකා ජාතික සංගමය බිහිවීම
  1921 සමස්ත ලංකා ද්‍රවිඩ මහජන සභාව
  1921 මැලේ දේශපාලන සංවිධානය
  1927 උඩරට ජාතික සභාව
  1936 සිංහල මහා සභාව
  1945 ද්‍රවිඩ සංගමය

- විවිධ දේශපාලන පක්ෂ බිහිවීම
  - ඒ.ඊ. ගුණසිංහ මහතාගේ නායකත්වයෙන් 1923 දී ලංකා කම්කරු පක්ෂය ඇරඹීම.
  - වාමාංශික ව්‍යාපාරය - ඉංග්‍රීසි උගත් මධ්‍යම පාන්තික තරුණ කොටස් බ්‍රිතාන්‍යයට ගොස් අධ්‍යාපනය ලබා නැවත සියරට පැමිණීමෙන් පසු ඇරඹීම.
  - ලංකාවට නිදහස ලබා ගැනීම හා සමාජවාදී ජන සමාජයක් බිහි කිරීමේ අරමුණ.
  - සුරියමල් ව්‍යාපාරය.
  - 1935 දී ලංකා සමසමාජ පක්ෂය ආචාර්ය එන්.එම්.පෙරේරා මහතාගේ නායකත්වයෙන් ඇරඹීම.
  - 1943 දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ඇරඹීම.
  - 1943 ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතාගේ නායකත්වයෙන් බොල්ෂේවික් ලෙනිනිස්ට් පත්ෂය ඇරඹීම.

- 1919 දී බිහි වූ ලංකා ජාතික සංගමය 1946 දී එක්සත් ජාතික පක්ෂය නමින් දේශපාලන පක්ෂයක් ලෙස ඩී.එස්. සේනානායක මහතාගේ නායකත්වය යටතේ බිහිවීම.

- 1947 මහ මැතිවරණය

| ඉදිරිපත් වූ දේශපාලන පක්ෂ | නායකත්වය |
|---|---|
| එක්සත් ජාතික පක්ෂය | ඩී.එස්.සේනානායක මහතාගේ නායකත්වයෙන් |
| ලංකා සමසමාජ පක්ෂය | ආචාර්ය එන්.එම්.පෙරේරා මහතාගේ නායකත්වයෙන් |
| බොල්ෂෙවික් ලෙනින්ස්ට් පක්ෂය | ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතාගේ නායකත්වයෙන් |
| ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය | දොස්තර එස්.ඒ වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් |
| ලංකා කම්කරු පක්ෂය | ඒ.ඊ.ගුණසිංහ මහතාගේ නායකත්වයෙන් |
| සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය | ජී.ජී.පොන්නම්බලම් මහතාගේ නායකත්වයෙන් |
| ලංකා ඉන්දියානු කොංග්‍රසය | එස්.තොන්ඩමන් මහතාගේ නායකත්වයෙන් |

- පසුකාලීනව හට ගත් විවිධ දේශපාලන මත ගැටුම් හා වෙනත් හේතු මත බිහි වූ දේශපාලන පක්ෂ ගණනාවක් විය.
  - එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා 1951 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීම.
  - සමස්ත ලංකා ද්‍රවිඩ සංගමයෙන් බිදී ගිය එස්.ජේ.වී. චෙල්වනායගම් මහතාගේ නායකත්වයෙන් 1949 දී ෆෙඩරල් පක්ෂය බිහිවීම.
  - 1956 දී මහජන එක්සත් පෙරමුණ බිහිවීම.
  - එක්දහස් නමසිය හැට දශකයේ මැද භාගයේ දී පමණ පසුව ජනතා විමුක්ති පෙරමුණ රෝහණ විජේවීර මහතාගේ නායකත්වයෙන් බිහිවීම.
  - 1970 දී ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ බිහිවීම.

- මෑත කාලයේ බිහි වූ දේශපාලන පක්ෂ රාශියක් දක්නට තිබීම
  - ශ්‍රී ලංකා මහජන පක්ෂය
  - ජාතික හෙළ උරුමය
  - මුස්ලිම් කොංග්‍රසය

- මැතිවරණවල දී බහුතරය ලබා ගැනීම සඳහා පොදු එකගතා මත පක්ෂ කීපයක් එක්ව සන්ධානගත වීම.

  නිද : 1960, 1970, 1994 මැතිවරණවල දී

- කැබිනට් ක්‍රමය
    - සොල්බරි ආණ්ඩුක්‍රමය මගින් කැබිනට් ක්‍රමය ලංකාවට ලැබීම.
    - බ්‍රිතාන්‍ය සම්ප්‍රදායයේ පාර්ලිමේන්තුවක විශේෂ ලක්ෂණයක් ලෙස කැබිනට් ක්‍රමය.
    - අගමැති එහි ප්‍රධානියා වීම.
    - අගමැති විසින් ඇමති මණ්ඩලය පත් කිරීම.

  - කැබිනට් මණ්ඩලයේ වගකීම.
    - විධායක කටයුතු පිළිබඳ පූර්ණ වගකීම.
    - මුදල් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම.
    - සංවර්ධන සැලසුම් සකස්කර ඉදිරිපත් කිරීම.

  - කැබිනට් මණ්ඩලයේ සාමූහක වගකීම
    - රජයේ සියලු ම කටයුතුවලට සියලු ම ඇමතිවරු කණ්ඩායමක් ලෙස සාමූහිකව වගකිය යුතු වීම.

## 11.6.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන

1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- 1947 පිහිටුවන ලද සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව අහෝසි කොට 1972 මැයි 22 දින ශ්‍රී ලංකාව ප්‍රථම වරට "නිදහස් ස්වෛරී ස්වාධීන ජන රජයක් බවට පත්වීම.

- මෙතෙක් පැවති ආග්‍රාණ්ඩුකාර පදවිය වෙනුවට ජනාධිපති පදවියක් ඇති කිරීම. ජනාධිපතිවරයා
  - නාම මාත්‍ර විධායකයෙක් වීම.
  - අගමැති විසින් නම් කිරීමෙන් පත් කිරීම.

- බලතල හා කාර්යයන්
  - සියලු බලතල ක්‍රියාත්මක කළ යුත්තේ අගමැතිවරයාගේ උපදෙස් අනුව වීම.
  - ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි වීම.

- මන්ත්‍රී මණ්ඩලය
  - මෙතෙක් පැවති නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 'ජාතික රාජ්‍ය සභාව ' යනුවෙන් නම් කිරීම.

- ජාතික රාජ්‍ය සභාව ජනරජයේ උත්තරීතර ආයතනය වීම.
- ව්‍යාවස්ථාදායක බලය කෙළින් ම ජාතික රාජ්‍ය සභාව මගින් ක්‍රියාත්මක කිරීම.
- විධායක බලය ජනාධිපති හා අමාත්‍ය මණ්ඩලය මගින් ද අධිකරණ බලය අධිකරණ පද්ධතිය මගින් ද ක්‍රියාත්මක වීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරෙන කාර්ය ඉටු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම විශේෂිත ලක්ෂණයක් වීම.

- අගමැතිවරයා හා කැබිනට් මණ්ඩලය
  - අගමැති පත්වන ආකාරය - බලතල හා කාර්ය
  - ඇමති මණ්ඩලය පත්වන ආකාරය - බලතල හා කාර්ය

- අධිකරණ සංවිධානය
  - යුක්තිය පසිඳලීමේ පනත ( 1973 අංක 44 දරන පනත )
  - කාර්මික ආරවුල් පනත
  - මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්
  - ශ්‍රේෂ්ඨාධිකරණය ජනරජයේ ඉහළ ම අධිකරණයත් අභියාචනා අධිකරණයත් වීම.
- මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබීම විශේෂ ලක්ෂණයක් වීම.

- ක්‍රි.ව. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යාවස්ථාව
  - 1978 අගෝස්තු 31 දින සම්මත විය.
  - මෙම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයකි.
- පූර්ණ විධායක බලතල සහිත ජනාධිපතිවරයෙකු සහිත ආණ්ඩුක්‍රමයක් වීම.
  - ජනාධිපතිවරයා
    * පත් කෙරන ආකාරය - සෘජු මහජන ඡන්දයෙන්
    * බලතල හා කාර්යයන්
    * ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව
    * ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි ප්‍රධානියා ද වීම.
- අගමැති හා අමාත්‍ය මණ්ඩලය - කැබිනට් මණ්ඩලය
  - ජනාධිපති විසින් පත් කරනු ලැබීම.
  - අගමැති නාම මාත්‍රික පදවියක් වීම.
  - අගමැති ඇතුළු අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටීම.
  - කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ජනාධිපති වීම.
  - ජනාධිපතිවරයා සිය විධායක කාර්යයන් මෙහෙයවන්නේත්, ඉටු කරන්නේත්, ක්‍රියාත්මක කරවන්නේත් අමාත්‍ය මණ්ඩලය මගින් වීම.

- පාර්ලිමේන්තුව
    - ජාතික රාජ්‍ය සභාව ලෙස හැඳින්වූ ව්‍යවස්ථාදායක මණ්ඩලය පාර්ලිමේන්තුව ලෙස හැඳින්වීම
    - පාර්ලිමේන්තුවේ නියෝජිතයන් සංඛ්‍යාව එහි සංයුතිය හා පත් කෙරෙන ආකාරය
        * මැතිවරණ කොට්ඨාශ
        * සමානුපාතික නියෝජන ක්‍රමය
        * මහජන ඡන්දයෙන් හා ජාතික ලැයිස්තුවෙන් පත් කිරීම.

- පාර්ලිමේන්තුවේ කාර්ය භාරය
    - රටේ විධිමත් පාලනය උදෙසා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

- ජනමත විචාරණය
    - ජනතාව සිය ව්‍යාවස්ථාදායක බලය ක්‍රියාත්මක කරන එක් ආකාරයක් ලෙස ජනමත විචාරණය දැක්විය හැකි වීම.

- අධිකරණ පද්ධතිය
    - ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියා පද්ධතිය මෙහෙයවාලීම සඳහා අධිකරණ ආයතන හය පිහිටුවා ඇත.
        1. ශ්‍රේෂ්ඨාධිකරණය
        2. අභියාචනාධිකරණය
        3. මහාධිකරණය
        4. දිසාධිකරණය
        5. මහේස්ත්‍රාත් උසාවි
        6. ප්‍රාථමික උසාවි

- අධිකරණයේ ස්වාධීනත්වය
    - අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ විධිවිධාන (ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 107 සිට 117 වගන්තිය දක්වා දැක්වේ )

- මූලික අයිතිවාසිකම්
    - 1978 ව්‍යාවස්ථාවේ මූලික අයිතිවාසිකම් පැහැදිලිව දක්වා තිබීම
    - මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවක ගත හැකි ක්‍රියා මාර්ග
    - පාර්ලිමේන්තු කොමසාරිස්වරයා ( ඔම්බුඩ්ස්මන් )

- පළාත් පාලන ක්‍රමයේ ඇති කරන ලද වෙනස්කම්
    - 1987 පළාත් සභා ඇති කිරීම ( ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 13 සංශෝධන )
    - 1987 දී ප්‍රාදේශීය සභා පිහිටුවීම

- වර්තමාන ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය
    - පළාත් සභාව
    - මහ නගර සභාව
    - නගර සභාව
    - ප්‍රාදේශීය සභාව

- පළාත් සභා සතු බලතල
    - විමධ්‍ය ගත බලතල 37කි
      ( 13 වැනි ආණ්ඩුක්‍රම සංශෝධනයේ නව වැනි උප ලේඛනය අනුව )

## 11.6.3 නිදහසින් පසු සංවර්ධනය සඳහා ගත් ක්‍රියා මාර්ග

- අධ්‍යාපනය
    - නිදහසින් පසු අධ්‍යාපනය සැලසුම් ගත කොට ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගණනාවක් ගනු ලැබීම.
        * 1950 අධ්‍යාපන ධවල පත්‍රිකාව
          භාෂා භේදයක් නොසලකා අධ්‍යාපනය ප්‍රාථමික/ද්වීතියික හා උසස් වශයෙන් අවස්ථා තුනකට බෙදීම.
        * වයස 5 - 14 දක්වා අධ්‍යාපනය අනිවාර්ය කිරීම.
        * ආධාර ලබන පාසල් පිහිටුවීමට තිබූ බාධා ඉවත්වීම.

    - 1956 බලයට පත් රජය යටතේ අධ්‍යාපනයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවීම.
        * ද්විතීය අධ්‍යාපනය අවසානය දක්වා මව් බසින් ලබා දීමට තීරණය කිරීම.
        * පාසල් දිවා ආහාරය නැවත ලබා දීම.
        * අටවැන්නේ විද්‍යා ශිෂ්‍යත්වය පිහිටුවීම.
        * ජ්‍යෙෂ්ඨ පාඨශාලා ලෙස හැඳින්වූ පාසල් මහා විද්‍යාල බවට පත්වීම
        * හැම මහ විදුහලකට ම විද්‍යාගාරයක් බැගින් ලබාදීම
        * 1958 දී විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාල පිහිටුවීම
        * 1960 දී ආධාර ලබන පාසල් හා ගුරු විද්‍යාල ( විශේෂ විධිවිධාන ) පනත යටතේ උපකෘත පාසල් රජයට පවරා ගැනීම.

    - ජාතික අධ්‍යාපන කොමිසම පත් කිරීම - 1961 මාර්තු (ජේ.ඊ.ජයසූරිය - සභාපති )
    - කාර්මික අධ්‍යාපනය කොමිසම ( ටී.පී. ද එස් මුණසිංහ සභාපති )
    - 1964 ධවල පත්‍රිකාව
    - 1966 ධවල පත්‍රිකාව

- 1966 අංක 20 දරණ උසස් අධ්‍යාපන පනත
    * උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික සභාවක් පිහිටුවීම, උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම හා පරිපාලනය සඳහාත් විධි විධාන සලස්වනු පිණිස පනවන ලද පනතකි.
    * කනිෂ්ඨ විශ්ව විද්‍යාල පිහිටුවීම

- 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
    * පාසලට ඇතුළත් කිරීමේ වයස අවුරුදු හය බවට පත් කිරීම.
    * විෂයමාලාවේ වෙනස්වීම් - ප්‍රාග් වෘත්තීය විෂය ඇරඹීම.
    * "සමාජ අධ්‍යයනය" නව විෂය හඳුන්වා දීම.
    * සේවාස්ථ ගුරු පුහුණුව ආරම්භ කිරීම.

- 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව
    * අඛන්ඩ ඇගයීම් වැඩ පළිවෙල
    * අධ්‍යාපන පරිපාලනය විමධ්‍යගත කිරීම

- විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ වර්ධනය
    * අලුතෙන් විශ්ව විද්‍යාල පිහිටුවීම

• කෘෂිකර්මය
    - නිදහසින් පසු යැපුම් කෘෂි කර්මයේ ඇති වූ වෙනස්කම්
    * ඉඩම් නොමැති අයට ඉඩම් ලබාදීම
    * ගොවි ජනපද ව්‍යාපාර
    * ප්‍රධාන වැව් යටතේ වූ ජල සම්පාදන ව්‍යාපාර
    * පළමු බහු කාර්ය යෝජනා ක්‍රමය ගල්ඔය ව්‍යාපාරය
    * වී ගොවීන්ගේ සුභ සාධනය සඳහා ගත් ක්‍රියා මාර්ග
        - කුඹුරු පනත
        - පොහොර සහනාධාරය
        - සහතික මිල
        - වියළි කලාපීය සංවර්ධනය සඳහා වූ යෝජනා අනුව මහවැලි ව්‍යාපාරය, උඩවලව ව්‍යාපාරය හා වෙනත් ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාර
    - වැවිලි කර්මාන්ත ජනසතු කිරීම ( රාජ්‍ය වැවිලි සංස්ථාව )
    - 1972 සහ 1975 ඉඩම් ප්‍රතිසංස්කරණය

- ඉඩම් ජන සතු කිරීම ( ජන වසම )
    * ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය
    * සමූපකාර ගොවිපල ක්‍රමය ආරම්භ කිරීම
- වැවිලි භෝග සංවර්ධනය සඳහා ගත් ක්‍රියා මාර්ග - තේ, පොල්, රබර් හා සුළු අපනයන භෝග

- රාජ්‍ය ව්‍යවසාය
    - ජනසතු සේවා ආරම්භය 1956 එස්. ඩබ්. ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ රජය යටතේ
        * ප්‍රවාහනය, වරාය ජනසතු කිරීම
        * බැංකු, මහජන බැංකුව ආරම්භ කිරීම
- කර්මාන්ත
    - නිදහස ලබන අවධියේ තිබූ කර්මාන්ත ස්වල්පයකි.
    - පාඩු ලබමින් තිබූ කම්හල් වසා දැමීම.
    - තුනීලෑලි , සම්භාණ්ඩ, පින්තල භාණ්ඩ යනා දී කර්මාන්ත දියුණුවට කටයුතු යෙදීම.
    - සිමෙන්ති, කඩදාසි, පිගන්, රසායන ද්‍රව්‍ය කම්හල් අළුතෙන් ඇරඹීම.
    - 1950 ගණන්වල දී පිහිටුවන ලද වාණිජ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් රෙදිපිළි, සබන්, කඩදාසි, රසකැවිලි. වැනි කර්මාන්ත සඳහා ණය පහසුකම් සැපයීම.
    - 1956 න් පසු කර්මාන්ත සඳහා රජයේ මැදිහත්වීම.
    - 1957 රාජ්‍ය කාර්මික සංස්ථා පනත පිහිටුවීම.
    - 1962 ඒකල කාර්මික ජනපදය පිහිටුවීම.
    - 1969 කාර්මික සේවා පහසුකම් සැලසීම පරමාර්ථ කොට ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවීම.
    - 1970 - 1977 කර්මාන්ත සඳහා රාජ්‍ය අංශයේ දැඩි මැදිහත්වීම
        * සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක් මත කර්මාන්ත සංවර්ධනය කිරීම
    - 1977න් පසු අවධිය - විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් මත කර්මාන්ත සංවර්ධනය
        * රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශයේ දායකත්වයට ඉඩ සැලසීම
        * 1978 දී මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටුවීම
        * 1978 දී ප්‍රථම අපනයන සැලසුම් කලාපය කටුනායක පිහිටුවීම
        * 1979 දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව පිහිටුවීම
        * 1979 දී අපනයන සංවර්ධන මණ්ඩලය පිහිටුවීම

- සමාජ සුභ සාධනය
  - සෞඛ්‍යය
    * නොමිලේ සෞඛ්‍ය පහසුකම් ලබාදීම
    * රෝහල් පහසුකම් වැඩි දියුණු කිරීම
    * ලෙඩ රෝග මර්ධනය සඳහා ගෙන ඇති විවිධ ක්‍රියා මාර්ග

  - ප්‍රවාහනය
    * ප්‍රවාහන සේවා ජනසතු කිරීම
    * මාර්ග පහසුකම් වැඩ දියුණු කිරීම, අධිවේගී මාර්ග
    * වරාය පහසුකම් වර්ධනය කිරීම

  - සන්නිවේදනය
    * තැපැල් හා විදුලි සංදේශ සේවාවල දියුණුව
    * දුරකථන පහසුකම්
    * ගුවන් විදුලි හා රූපවාහිනී සේවාවන්ගේ දියුණුව

# ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ
# දීර්ඝ කිරීමේ උපකරණ

1. ඇගයීම අවස්ථාව :- වරය 01 - උපකරණය - 01
2. ආවරණය කරන නිපුණතා මට්ටම්
   - පාලනයේ සිදු වූ දුර්වලතා ප්‍රයෝජනයට ගනිමින් බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය විග්‍රහ කරයි.
   - ස්වාධිපත්‍ය රැක ගැනීම සඳහා බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ස්වදේශිකයින් නැගී සිටි ආකාරය විග්‍රහ කරයි.
   - බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති කළ ප්‍රතිසංස්කරණයන් පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

3. ආවරණය කරන විෂය සන්ධාරය
   11.1.1 - 11.1.2, 11.1.3, 11.2, 11.2.1, 11.2.2, 11.2.3

4. උපකරණයේ ස්වභාවය - ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන
5. උපකරණයේ අරමුණු
   - ශ්‍රී ලංකාවේ පාලන බලය බ්‍රිතාන්‍යයන්ට හිමි වූ ආකාරය අධ්‍යයනය කිරීමට යොමු කිරීම
   - බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ඇති වූ නිදහස් අරගල පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීම.
   - පාර්ලිමේන්තු ආණ්ඩුකාර ක්‍රමය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වීම දක්වා පාලන හා පරිපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ තොරතුරු අධ්‍යයනයට සිසුන් යොමු කිරීම
   - බ්‍රිතාන්‍ය පාලනය හේතුකොට ගෙන ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

   <u>ගුරු උපදෙස්</u>
   - ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පැවැත්වෙන ආකාරය හා පැවැත්වෙන දිනය දැනුම් දෙන්න.
   - ප්‍රශ්න සකස් කිරීම සඳහා පන්තිය කණ්ඩායම් කරන්න.
   - එක් එක් කණ්ඩායම ප්‍රශ්න සකස් කිරීම සඳහා යොදා ගත යුතු විෂය ඒකක, උප ඒකක හඳුන්වා දෙන්න.

     I කණ්ඩායම - 11.1.1, 11.1.2
     II කන්ඩායම - 11.1.3, ( ක්‍රි.ව. 1924 දක්වා )
     III කණ්ඩායම - 11.1.3 ( ක්‍රි.ව. 1931, 1947 )
     IV කණ්ඩායම - 11.2.1, 11.2.2. 11.2.3

- එක් කණ්ඩායමක් විසින් සකස් කළ යුතු ප්‍රශ්න සංඛ්‍යාව ( වැඩ සටහනට ගැළපෙන පරිදි ) සිසුන්ට දැනුම් දෙන්න.
- ප්‍රශ්න සකස් කළ යුතු ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
  උදා : කණ්ඩායමට ලැබුණ විෂය ඒකකවලට අදාළ ව නිශ්චිත කෙටි පිළිතුරු සහිත
- ප්‍රශ්න සකස් කර ගෙන ආ යුතු දිනය දැනුම් දෙන්න.
- සකස් කළ ප්‍රශ්න කියවා අවශ්‍ය සංස්කරණයන් කරන්න.
- මෙම වැඩ සටහනෙන් ආවරණය වන විෂය ක්ෂේත්‍රය හොඳින් අධ්‍යයනය කර වැඩ සටහනට සූදානම් වන ලෙස සිසුන්ට දැනුම් දෙන්න.
- නියමිත දින ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පැවැත්වීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ගන්න.
- සිසුන්ගේ මෙහෙයවීමෙන් තරගය පැවැත්වීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ප්‍රශ්න සඳහා සිසුන් දෙන පිළිතුරු වැරදි වන අවස්ථාවල ඒවා නිවැරදි කරන්න.
- සුදුසු පරිදි ලකුණු පැවරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ගන්න.

<u>සිසුන්ට උපදෙස්</u>

- ගුරුතුමා / ගුරුතුමිය උපදෙස් පරිදි තම කණ්ඩායමට ලැබුණ ඒකකවලට අදාළව නියමිත ප්‍රශ්න සංඛ්‍යාව සකස් කරන්න.
- 11.1, 11.2 ඒකක හොඳින් අධ්‍යයනය කර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සූදානම් වන්න.
- වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සහාය වන්න.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
# දීර්ඝ කිරීමේ උපකරණ

01 ඇගයීම් අවස්ථාව වාරය 02 උපකරණය 02

02 ආවරණය කරන නිපුණතා මට්ටම්

- ජපානය ලෝකයේ ප්‍රබල රටක් ලෙස ගොඩ නැගුණ ආකාරය අධ්‍යයනය කර ඉන් ලබා ගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි.
- රටේ ස්වාධිපත්‍ය සඳහා ඉන්දියානුවන් ආදර්ශමත් ලෙස ක්‍රියා කළ ආකාරය ආදර්ශනයට ගෙන කටයුතු කරයි.
- සැලැස්මකට අනුව කටයුතු කරමින් චීනය නැගී සිට ආකාරය අධ්‍යයනය කර ඉන් ලබාගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි.
- පළමුවන හා දෙවන ලෝක සංග්‍රාම මානව සංහතියේ ඉදිරි ගමනට බාධාකාරී වූ ආකාරය විමර්ශනය කරමින් සංග්‍රාම තත්ත්වයන්ගෙන් වැළකී සිටීමට කටයුතු කරයි.
- ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශක්තිමත් භාවය විග්‍රහ කරයි.
- පැසිස්ට් වාදයේ හා නාසි වාදයේ ලක්ෂණ විමසා බලයි.

3. ආවරණය කරන විෂය සන්ධාරය :- 11.3, 11.4

4. උපකරණයේ ස්වභාවය :- ප්‍රදර්ශනයක් පැවැත්වීම

05. උපකරණයේ අරමුණු

- විසිවන සියවසේ ආසියාතික රටවල නැගී ඒම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කිරීම
- පළමුවන ලෝක සංග්‍රාමයට තුඩුදුන් හේතු විමසා බැලීම හා එහි ප්‍රතිඵල හඳුනා ගැනීම
- ජාතීන්ගේ සංගමය බිහිවීමට පසුබිම් වූ හේතු, එහි අරමුණු හා බිඳ වැටමට හේතු වූ කරුණු විමර්ශනය කිරීමට යොමු කිරීම
- දෙවන ලෝක සංග්‍රාමය ඇති වීමට තුඩු දුන් හේතු හා ප්‍රතිඵල අධ්‍යයනය කිරීම
- එක්සත් ජාතීන්ගේ ආරම්භය, අරමුණු, ව්‍යුහය හා ලෝක සාමය සඳහා ගත් පියවර පිළිබඳ තොරතුරු විමසා බැලීමට යොමු කිරීම.

06. උපකරණය ක්‍රියාත්මක කිරීම හා උපදෙස්

<u>ගුරු උපදෙස්</u>

- ක්‍රියාකාරකම පදනම් වන විෂය ඒකකය හා ක්‍රියාකාරකමෙහි අරමුණු පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට, අදාළ මාතෘකා පවරන්න.

I කණ්ඩායම - ඉන්දියාව
- ජාතික ව්‍යාපාරය
- මහත්මා ගාන්ධි තුමා
- ඉන්දියාව බෙදී යාම

II කන්ඩායම - ජපානය
- ටොකුගාවා යුගය
- මෙයිජි ප්‍රතිසංස්කරණ
- ජපානයේ නැගී සිටීම
- හිරෝෂිමා නාගසාකී විනාශය
- මාර්ෂල් සැලැස්ම ඇසුරින් යළි ගොඩ නැගීම

III කණ්ඩායම - චීනය
- චීන විප්ලවයේ ප්‍රධාන අවස්ථා
- මහජන චීනයේ බිහිවීම
- ආර්ථික සැලසුම්
- සංස්කෘතික විප්ලවය

IV කණ්ඩායම - පළමුවන ලෝක යුද්ධය
- යුද්ධයට හේතු
- ප්‍රධාන පාර්ශවකරුවන්
- ප්‍රතිඵල
- ජාතීන්ගේ සංගමය

V කණ්ඩායම - දෙවන ලෝක යුද්ධය
- පැසිස්ට් වාදයේ නැගීම
- නාසි වාදයේ නැගීම
- දෙවන ලෝක යුද්ධයට හේතු
- ප්‍රධාන පාර්ශවකරුවන්
- ප්‍රතිඵල

VI කන්ඩායම - එක්සත් ජාතීන්ගේ සංවිධානය
- ආරම්භය
- අරමුණු
- ව්‍යුහය
- සාමය සඳහා ගත් ප්‍රයත්න

- එක් එක් කණ්ඩායමට ප්‍රදර්ශනය සඳහා සැකසිය හැකි උපකරණ පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- තමන් ඉදිරිපත් කරන ප්‍රදර්ශන භාණ්ඩය පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න